
# පාර්ලිමේන්තු විත්ති

වත්මන් පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලට සතළිස් වසරක් සපිරීම නිමිත්තෙන්

නිකුත් කරනු ලබන විශේෂ පුවත් හසුන කලාපය

~ 1982 - 2022 ~



සන්නිවේදන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# අන්තර්ගතය


- කථානායකතුමාගේ පණිවිඩය
- මහ ලේකම්තුමාගේ පණිවිඩය
- දියවන්නා පාර්ලිමේන්තු සංකීර්ණයට අවුරුදු 40 සපිරෙයි.
- ජය බිමෙන් නව යුගයක් - 1982 අප්‍රේල් මස 29 වන දින දිනමිණ පුවත්පතේ ප්‍රධාන පුවත.
- On democracy: design of the new Sri Lankan Parliament by Geoffrey Bawa.
- පාර්ලිමේන්තු සභා ගර්භය
- ජය බිමෙන් නව යුගයක් - 1982 අප්‍රේල් මස 29 වන දින දිනමිණ පුවත්පතේ පුවත්
- ජෙෆ්‍රි බාවා : නිවර්තන නූතනවාදයේ පුරෝගාමී සලකුණ
- පැරණි පාර්ලිමේන්තුවේ පළමු කථානායක ආසනයේ කථාව
- ප්‍රජාතන්ත්‍රවාදයේ දෘශ්‍යමය අභිෂේකය; ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
- පැරණි පාර්ලිමේන්තුවේ දෙවන කථානායක අසුන
- පොකුරු පහනේ පුරාවත
- Memories of four decades (40 years) of Parliament life
- සෙංකෝලය
- අදටත් නව්‍යවාදී හරිතමය පාර්ලිමේන්තුව කරා අප ආ ගමන
- ප්‍රධාන ද්වාරය
- සභා ගර්භයේ ප්‍රධාන ද්වාරය
- “නව අගනුවර බබළවන මිණි කිරුළ” - 1982 අප්‍රේල් මස 29 වන දින දිනමිණ පුවත්පතේ විශේෂාංග
- පාර්ලිමේන්තුවට සපැමිණි විශේෂ අමුත්තන්
- පාර්ලිමේන්තු සභා ගර්භයේ සීමාව
- පැරණි පාර්ලිමේන්තුවේ චේත්‍රධාරී අසුන
- අපේ පාර්ලිමේන්තුව පසු කළ දේශපාලන ප්‍රතිසංස්කරණ සැකෙවින්
- “නව පාර්ලිමේන්තු මැදුරේ ජනතාවට වැඩි පහසුකම්” - 1982 අප්‍රේල් මස 29 වන දින දිනමිණ පුවත්පතේ විශේෂාංග
- “මල්වැසි ආසිරි මැද්දේ නව මැදුරට පිවිසේ” - 1982 අප්‍රේල් මස 30 වන දින දිනමිණ පුවත්පතේ විශේෂාංග
- මහජනයා අතරට එන ඔබේ පාර්ලිමේන්තුව
- පාර්ලිමේන්තු කාරක සභා
- The Kotte period revived… - Main news – Daily News - April 30th ,1982
- පාර්ලිමේන්තුව සැකෙවින්... අප්‍රේල් - 2022
- පාර්ලිමේන්තු බෝධීන් වහන්සේ...

## කථානායකතුමාගේ පණිවිඩය



**මේ බක්මස විසිනව වැනි දිනට, ලක්වැසි මහජනතාවගේ උත්තරීතර පරමාධිපත්‍යයය අබිසෙස් ගැන්වෙන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පෞරාණික නුවරට පිවිස, අපූර්ව ගෘහ නිර්මාණයෙන් සුසැදි ගොඩනැගිල්ලකට ප්‍රවේශව පුරා සතළිස්වියක් ගතවෙයි.**

පාර්ලිමේන්තුව ජයවර්ධනපුර කෝට්ටේ අගනගරයට ප්‍රවිෂ්ට වීමට, අඩ සියවසකට පූර්වයෙන් මේ පළාත් පැවැති ආකාරයට වඩා අද මෙහි වටපිටාව බෙහෙවින් වෙනස්ව තිබේ. මා කතා කරන්නේ පියවි දැසින් ඔබ නිරීක්ෂණය කරනා නාගරීකරණය හෝ අලුත් මැද පන්තියේ නැගීම සහ බැසීම අරබයා පමණක් නොවේ. අනේක විධ සුළිසුළං, මහා වර්ෂා, කැළඹීම්, උදම් රළ පෙළ, නාය යාම් සහ භූමිකම්පා ඈ සියලු විපර්යාස මධ්‍යයෙහි මහා රජදවස පැරණි බලකොටුවක් උත්තුංගව, අවිච්ඡින්නව නැගී සිටින්නේ යම් සේ වේ ද අපේ පාර්ලිමේන්තුව ද මහජනයා සමඟ ඒකාත්මිකව සිටිනුයේ වෙයි.

එහෙයින්, කථානායක අසුන අරා හිඳගෙන මේ තේජාන්විත සභාගර්භය දෙස බලාපොරොත්තුවෙන් බලනවිට මට සෑම රැස්වීම් දිනෙකම උදාවෙහි පසක් වන නිසැක සිතුවිල්ලක් වෙයි. මේ සභාගර්භයේ සෑම නියෝජිතයෙකු හා සමගම ලක් පුරවැසියන් සමූහයකගේ මැකී යා නොදී කටහඬ බැඳී ඇති බවයි. ඒ හුදී ජනයෝ මෙහි නොආවද ඔවුන්ගේ සිනා, කඳුළු හෘද ස්පන්දනයද මෙන්ම දාඩිය සුවඳද මහජන නියෝජිතයන් මඟින් අපි හඳුනමු.

මේ සතළිස් විය සපුරන්නේ ඒ ජනතාවගේ පාර්ලිමේන්තුවයි. මෙතුවක් කල් නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය ඇතුළු රටට බොහෝ යහපත් ජයග්‍රහණ දිනාදුන් සේම තව අනන්ත ජයග්‍රහණ මෙසිරිලකට ලබන්නට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව කප් සුවහස් කලක් දිනේවා!

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
**කථානායක**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

## මහ ලේකම්තුමාගේ පණිවිඩය



ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක් මෙහෙයවීමේ මූලික කාර්යභාරය සහ වගකීම පාර්ලිමේන්තුව සතුය. රාජ්‍ය මූල්‍ය පාලනය වඩාත් ක්‍රමවත්ව පවත්වාගනිමින්, නීති සම්පාදනය කිරීමේ කාර්යයේ නිරත වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වර්තමානයේදී පෙරට වඩා ශ්‍රී ලාංකික පුරවැසියා වෙත වඩ වඩාත් සමීප වෙමින් කටයුතු කරමින් සිටියි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටා ඇති වත්මන් පාර්ලිමේන්තු සංකීර්ණය අභිනවයෙන් ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සඳහා විවෘත කෙරෙනුයේ 1982 අප්‍රේල් 29 වැනිදාය. එනයින්, එය 2022 අප්‍රේල් 29 වැනි දිනට වසර 40ක් සපුරනු ලබයි. ශ්‍රී ලාංකික කලා සම්ප්‍රදායන් මුල් කරගනිමින් නිර්මාණය කොට ඇති වර්ග මීටර් හතළිස් අටදහසක් පුරා පැතිරී ඇති මෙම පාර්ලිමේන්තු සංකීර්ණයේ සැලසුම නිර්මාණය කරනු ලැබුයේ සුප්‍රකට ගෘහ නිර්මාණ ශිල්පියෙකු වූ ජෙෆ්රි මැනිං බාවා විසිනි. පාර්ලිමේන්තු සංකීර්ණයේ පවත්නා විශිෂ්ට ගෘහ නිර්මාණ ශිල්පීයත්වය පිළිබඳව වර්තමානයේදී ලොව පුරා පර්යේෂකයන්, ගෘහ නිර්මාණ ශිල්පීන් සහ විද්‍යාර්ථීන් විසින් අධ්‍යයනය කරනු ලබයි.

මහජන පරමාධිපත්‍යයේ නියෝජිතයා වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට සිය ව්‍යවස්ථාදායක කාර්යයේ නියැලීමට අවශ්‍ය භෞතික සහ මානසික වාතාවරණය මැනවින් නිර්මාණය කිරීමට පාර්ලිමේන්තු සංකීර්ණයේ ගෘහ නිර්මාණ ශිල්පීය නිපුණතාවය සමත්වී තිබේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංයුතිය අනුව මන්ත්‍රීවරයන් 225 දෙනාට වඩාත් මහජන හිතකාමී තීන්දු තීරණවලට එළැඹීම වෙනුවෙන් නිමවා ඇති සභා ගර්භය, ඒ වටා මහජන සහභාගීත්ව වෙනුවෙන් පිහිටුවා ඇති මහජන ගැලරි මෙන්ම පාර්ලිමේන්තුව මහජනයා වෙත සමීප කිරීමේ අභිප්‍රායෙන් පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ පැරණි ගෘහනිර්මාණ ශිල්පක්‍රම අනුව ඉදිකර ඇති "අම්බලම" සංකල්පය ද වඩාත් මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තු ක්‍රමයක් පවත්වාගැනීම උදෙසා දිරිමත් කරනු ලබයි.

ගෙවීගිය වසර 40 පුරාවට ශ්‍රී ලාංකීය ජනසමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීම පිණිස හේතුවූ අණ පනත් ගණනාවක් මෙම පාර්ලිමේන්තු සභා ගර්භය තුළදී සම්මත කොට තිබේ. එය වඩාත් ශක්තිමත්ව ඉදිරියේදීත් සිදු වනු ඇත.

කොවිඩ් වසංගතය නිමවී රට නැවත යථා තත්ත්වයට පත් වූ සැනින් මෙරට පොදු මහජනතාවට, සිසු දරු දැරියන්ට, සංචාරක ප්‍රජාවට මෙන්ම අනෙකුත් සියලුදෙනාට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත පැමිණ එහි විශිෂ්ටත්වයේ ආශ්චර්ය විඳගැනීමට හැකිවනු ඇති බව මගේ විශ්වාසයයි.

**ධම්මික දසනායක**
**මහ ලේකම්**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

# දියවන්නා පාර්ලිමේන්තු සංකීර්ණයට අවුරුදු 40 සපිරෙයි

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි වර්තමාන ගොඩනැගිල්ල වෙත ස්ථාපිත කොට අප්‍රේල් 29 වැනිදාට වසර 40 ක් සපිරෙයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගාලු මුවදොර පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා 70 දශකය අගභාගය වන විට එය වෙනත් ගොඩනැගිල්ලකට ගෙනයාමේ අවශ්‍යතාවය මතු විය. මෙහිදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ නව පාර්ලිමේන්තු ගොනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා විණ. ඒ අනුව 1979 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ ප්‍රදේශයේ දියවන්නා ඔයේ පිහිටි අක්කර 16 කුඩා දූපතක අභිනව පාර්ලිමේන්තුව ඉදිකිරීම ආරම්භ කෙරිණි.

එවකට ජනාධිපතිවරයා වූ ජේ. ආර්. ජයවර්ධන මහතාගේ මගපෙන්වීම යටතේ එවකට අග්‍රාමාත්‍යවරයා වූ ආර්. ප්‍රේමදාස මහතා විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මෙහෙයවන ලදි. මේ අනුව, ජෙෆ්රි බාවා මහතා ප්‍රධාන ගෘහනිර්මාණ ශිල්පියා ලෙස තෝරාගන්නා ලද අතර ජපන් සමාගමකට මෙම නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු පවරා තිබුණි. මෙහිදී ශ්‍රී ලාංකේය සම්ප්‍රදායන් මුල්කරගෙන නිර්මාණය කර ඇති පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සියලු ගෘහනිර්මාණ කටයුතු සඳහා ස්වදේශීයත්වයට ප්‍රමුඛතාව ලබා දී තිබේ.


මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 1982 වර්ෂයේදී අවසන් වූ අතර 1982 අප්‍රේල් 29 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ පිහිටි අභිනව පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. මේ අනුව, එතෙක් ගාලු මුවදොර පිහිටි මෙරට ව්‍යවස්ථාදායකය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ඉදිකළ අභිනව පාර්ලිමේන්තු සංකීර්ණය වෙත ගෙන ඒම සිදු විය.

විශේෂයෙන්, නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල විවෘත කිරීමත් සමඟ ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ නගරය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන නගරය බවට පත්වීමද සිදු විය.

නා ගස් පෙළකින් සමන්විත පිවිසුම් මාර්ගය පසුකරමින් වර්තමාන පාර්ලිමේන්තු පරිශ්‍රයට පිවිසිය යුතුය. මෙහිදී පාර්ලිමේන්තුව මහජනයා වෙත සමීප කිරීමේ අරමුණෙන් පාර්ලිමේන්තු පරිශ්‍රයේ පැරණි ගෘහනිර්මාණ ශිල්පක්‍රම අනුව ඉදිකර ඇති “අම්බලම” යන සංකල්පය පදනම් කරගත් ස්ථාන කිහිපයක් දැකිය හැකිය. මෙම ස්ථාන දේශපාලඥයන් සහ ඔවුන් නියෝජනය කරන ප්‍රදේශයන්හි ජනතාව එක් රැස්වී සුහදව සාකච්ඡා කිරීමේ අරමුණින් ඉදිකරන ලද බව පැවසේ. එසේම පාර්ලිමේන්තු පිවිසුමේදී ජලය පිරි පොකුණ දැකගත හැකිය.

පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල ආචාර්ය මංජු ශ්‍රී චිත්‍ර ශිල්පියාගේ විශිෂ්ට බිතු සිතුවම් කිහිපයක් දැකිය හැකිය. සභා ගර්භයෙහි ප්‍රධාන ද්වාරය තඹ වලින් නිමවා රිදී තහඩුවකින් ආවරණය කර ඇති අතර එහි සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව කැටයම් කොට තිබේ.

පාර්ලිමේන්තුවේ සභා ගර්භය හැඩයෙන් ඍජුකෝණාශ්‍රාකාර වන අතර එය මහල් දෙකක් පුරා විසිරී පවතී. එසේම, රජවරුන්ට, පන්සල්වලට සහ කෝරළ වලට අයත් කොඩි 18ක් සභා ගර්භයේ ඉහළ කොටසේ දැකිය හැකිය. තවද සභා ගර්භයේ මධ්‍යයේ එල්ලා ඇති රිදී ආලේපිත පොකුරු පහන සභා ගර්භයට සුවිශේෂී ගාම්භීර බවක් එක් කරයි.



දිනමිණ
THE DINAMINA

ශ්‍රී ලංකාවේ අතිශය විශාල ලෙස අලෙවි වන දිනපතා පත්‍රය
THE DAILY WITH THE LARGEST CIRCULATION IN SRI LANKA.

THURSDAY, APRIL 29, 1982

ජය බිමෙන් නව යුගයක්

මංගල උළෙල අභිමානයෙන්



# ජය බිමෙන් නව යුගයක්

## මංගල උළෙල අභිමානයෙන්

ජාතියේ ඉදිරි ගමනෙහි නව යුගයක් උදා කරමින් ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ පුරවරය යළිත් ශ්‍රී ලංකාවේ අගනුවර බවට පත් කිරීමේ සහ එහි ඉදි කර ඇති අභිනව පාර්ලිමේන්තු මන්දිරය විවෘත කිරීමේ උත්සවය වාම් එහෙත් අභිමානවත් අයුරින් අද පැවැත්වෙයි.

නව පාර්ලිමේන්තු සංකීර්ණය සමග පළමුවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභා වාරය ද අද විවෘත කරන ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, ... පාර්ලිමේන්තුව අභිනව මංගල දෙසුම පවත්වයි.

පාර්ලිමේන්තුව විවෘත කෙරෙන ... ඇත්තේ අද උදේ 10.28 ටය.

## මහජන පහසුකම්

... ජනාධිපතිතුමන් විසින් පාර්ලිමේන්තු මන්දිරය විවෘත කිරීම ... නිවිත කරනු ලැබේ.

... පාර්ලිමේන්තුවේ සභා ගර්භයට ... ජනාධිපතිතුමා, මංගල ... පාර්ලිමේන්තු රැස්වීමේ ... පාර්ලිමේන්තුව ...

පාර්ලිමේන්තු සංකීර්ණයට ... විවිධ මහජන ක්‍රීඩාංග ... රූපවාහිනිය මගින් ප්‍රදර්ශනය කෙරේ.

නව පාර්ලිමේන්තු මන්දිරය විවෘත කිරීම නිමිත්තෙන්, මහා කලා සංදර්ශනයක් හා සංගීත සංදර්ශනයක් ... ද අද පස්වරු 4 සිට පැවැත්වේ.

මෙය පැවැත්වෙන්නේ, රාජ්‍ය ඇමති ආනන්ද තිස්ස ද අල්විස් මහතාගේ ප්‍රධානත්වයෙනි.

මුළු සටහන 4 වැනි පිටුවේ.

මහා සම්මතයෙන් තොවත් ජන සම්මතයෙන් රජ්‍ය කරවීමෙහි වරම් ලත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජය ජනතාවට දුන් ප්‍රමුඛ ප්‍රතිඥාවක් සම්පූර්ණ කරමින් සිරිලක විජය ... ජය භූමියක් වූ ශ්‍රී ජයවර්ධනපුර රැළි දෙන දියවන්නා ඔය මැද ඉදි කළ, ජන නේතාවරයන් ගේ මන්ත්‍රණය පිණිස වන නව පාර්ලිමේන්තු මන්දිරයේ සිදු ඇතුළු ද්වාරය අද පෙරවරු දහයයි විසිඅටට යෙදෙන සුබ නැකතින් ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමන් අතින් විවෘත වීමත් සමග ශ්‍රී ලංකා දේශපාලන වංශ කතාවේ ස්වර්ණමය යුගයක සමාරම්භය ද සිදුවන්නේ ය.

කෝට්ටේ මන්ත්‍රීශ්වරයාණන් ගේ ආරාධනයෙන්, අඩ වසල් මනසකින් ජීවත්වූ නිශ්ශබ්ද භූමියක පිහිටි අග නගරය නිව හල් මනසකින් ජීවත් වූ සජීව භූමියක ප්‍රතිෂ්ඨාපනය වන්නේය. මහජන හිත පිණිස වන මෙම මහා ප්‍රාසාදය වූ කලී මහා දේශපාලන වංශ කතාව සිද්ධ කෙරෙන, ජනතා අභිමානය ඉෂ්ට සිද්ධ කෙරෙන ප්‍රවේශය ය.

පෙරදු කල ආරේ ද, වාස්තු විද්‍යාවේ ද නව ශිල්පීය ප්‍රතිභාවේද විචිත්‍රනිර්මාණයක් වන මෙම ගොඩ මහා මන්දිරය ලොව අභිමුඛයෙහි අභිමානයෙන් දක්විය හැකි ජාතිය ලත් මහඟු දායාදයක්ම වන්නේය.

පුවත් හසුනට සකස් කළේ - සියාද් අහමඩ්


# On democracy: design of the new Sri Lankan Parliament by Geoffrey Bawa

- Shayari De Silva -
*Curator of Art & Archival Collections, Geoffrey Bawa Trust*

*In any democracy, there is perhaps no building as important as its parliament. As the building that indicates the identity and core values of a nation, it performs both as a signifier and as a building which houses the legislative branch of the government. I've always thought it fascinating that Geoffrey Bawa, an architect who was so reticent to state his politics or beliefs publicly, also designed the New Sri Lankan Parliament, perhaps the single most important civic institution in the country. In an interview with architect Channa Daswatte in 1995, Bawa remarked, "That's for others to do. You can find strong theoretical ideas in the work. If someone else can just as easily see the point of the whole project that is the whole theory."*

How might we view the parliament as an indication of Bawa's beliefs? Fundamentally, the parliament is configured as a central building surrounded by a series of smaller pavilions of varying size. Perhaps a metaphor for the structure of government in the country, it is the relationships between the various buildings that gives richness and cohesion to the overall complex. The central chamber of parliament is an exquisitely rendered space and clearly given primary importance in terms of furnishing. Emphasis is made on this space where key decisions which impact all citizens of the nation are made.


Early sketches in the Bawa archives show that design of the chamber initially had the upper viewing galleries open with views beyond; a visual connection that would no doubt have assisted in reminding the parliamentarians of the gravitas of their duties. We assume that the designed was later revised due to security concerns.



In his preface to Brian Brace Taylor's book Geoffrey Bawa Architect in Sri Lanka (1986), Bawa stated "I like to regard all past and present good architecture in Sri Lanka as just that — good Sri Lankan architecture — for this is what it is, not narrowly classified as Indian, Portuguese or Dutch, early Sinhalese or Kandyan or British Colonial, for all the good examples of these periods have taken the country itself into first account." Bawa understood Sri Lanka's identity as being multi-faceted, and multi-layered. Bawa himself was of mixed Muslim, European, Burgher and Sinhalese ancestry, his partner







at the firm the brilliant engineer Dr. Kandasamy Poologasundram was of Tamil ethnicity. Vasantha Jacobsen, the project architect, later became ordained as a Buddhist monk. Her name is included in the plaque at the entrance to the main building of the parliament. Four young architects from India joined Bawa's practice to assist with the project and the construction was carried out by the Japanese firm Mitsui, who had previously collaborated with Bawa's firm over the Ceylon Pavilion for the Expo '70 in Osaka. Unintentionally, the team that steered the project reflected the rich multiculturalism and of the island.
Dr Poologasundram, who not only engineered the project structurally but also in terms of ensuring it was completed within the specified three years, a remarkable feat in itself, use various mechanisms including bringing in prefabricated building components for the structure in order to speed up construction.

The project team was sequestered in artist Ena de Silva's house on Alfred Place, which Bawa had designed in the early 1960s and subsequently rented for this project, in order to ensure the desired levels of confidentiality was maintained. Ena would then go on to design many components of the parliament including the vertical banners and the ceilings while another celebrated artist and frequent collaborator with Bawa, Laki Senanayake, designed the silver talipot palm-leaf shaped chandelier which is placed at the centre of the ceiling in the main chamber.

Readers interested in knowing more about the possible sources of inspiration for the parliament design may pursue Dr. Shanti Jayawardena's excellent book, Geoffrey Manning Bawa: Decolonizing Architecture and for further descriptions of the design of the parliament, they may refer Geoffrey Bawa: the Complete Works. The mission to build new institutions architecturally and systemically was a drive shared by many post-independent nations; in India, Nehru invited the Swiss - French architect Le Corbusier to design the city of Chandigarh while in Bangladesh, the American Architect designed the new parliament. Both structures are impressive and rely on the language of Western Modernism to suggest a rupture from the colonial past and forge a new identity. It is remarkable that the Sri Lankan parliament was designed by a Sri Lankan firm, while relying on the cosmopolitan ties that have always defined the island.

The design of the Sri Lankan parliament is fused with the long and layered architectural history of the country, while also relying on modern technologies and contemporary requirements. The resulting architecture is indeed timeless.

# පාර්ලිමේන්තු සභා ගර්භය



පාර්ලිමේන්තු පරිශ්‍රයේ වඩාත්ම අවධානයට ලක්වන ශාලාව ලෙස සභා ගර්භය හැඳින්විය හැකිය. හැඩයෙන් ඍජුකෝණාශ්‍රාකාර වන එය සමස්ත ගොඩනැගිල්ලේ මධ්‍යම ප්‍රදේශයේ මහල් දෙකක් පුරා විසිරී ඇත.

වායු සමීකරණ පහසුකම් සහිත සභා ගර්භය ආසන 232 කින් සමන්විත වන අතර එම ආසන කථානායක අසුන දෙපස ආසන 116 බැගින් පනවා තිබේ.

සභා ගර්භයේ එක් කෙළවරක මධ්‍යයේ කථානායකවරයාගේ අසුන පනවා ඇත. කථානායකතුමාගේ අසුනට කෙළින්ම පහළින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, නියෝජ්‍ය මහ ලේකම්වරයා සහ සහකාර මහ ලේකම්වරයා සඳහා මේසය පිහිටුවා තිබේ. සභා ගර්භ සීමාවට පිටතින් කථානායක අසුන දර්ශනය වන පරිදි වේත්‍රධාරී සහ නියෝජ්‍ය වේත්‍රධාරීගේ ආසන පනවා ඇත.

සුවිශේෂී හැඩයකින් යුතු මෙහි සිවිලිම සකස් වී ඇත්තේ ඇනෝඩ පිරියම් කරන ලද ප්‍රමාණයෙන් වර්ග අඩියක් වූ ඇලුමිනියම් තහඩු විසිදහසකිනි. සැරසිලි සහිත මල නොබැඳෙන වානේ කණු මත නංවන ලද රජවරුන්ට, පන්සල්වලට සහ කෝරළවලට අයත් රිදියෙන් නිම කරන ලද ධජ දහ අටක් ද සභා ගර්භයේ ඉහළ කවයක සවි කර ඇති අඩි හතක් උස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය ද සභාගැබට ප්‍රතාපවත් බවක් එක් කරයි.

සිවිලිමේ මධ්‍ය ලක්ෂයේ සිට පහළට වැටෙන තඹයෙන් නිර්මිත රිදී ආලේප කළ යෝධ පහන සභාගර්භයේ චිත්තාකර්ෂණීයත්වය තීව්‍ර කිරීමට සමත් වී ඇත. මෙය කලා ශිල්පී ලකී සේනානායකයන්ගේ නිමැවුමකි.

සිවිලිම් ලාම්පුවලින්ද උඩුමහලේ නොපෙනෙන සේ සවිකර ඇති විදුලි පහන් මඟින් ද පොකුරු පහන මඟින් ද සෞම්‍ය ලෙස සභා ගැබ ආලෝකවත් වේ.

විශේෂ කාර්යයන් සඳහා වෙන් වූ විශේෂ කුටි කීපයක් සභා ගර්භයේ පහළ කොටසෙහි පිහිටා තිබේ. හැන්සාඩ් නිලධාරීන් සඳහා වෙන් වූ කුටි සහ පාර්ලිමේන්තු නිලධාරීන් සඳහා වෙන් වූ කුටි පිළිවෙලින් මූලාසනයේ වම් සහ දකුණු පැතිවල පිහිටා තිබේ. පාර්ලිමේන්තු කථා පරිවර්තකවරුන් සහ රජයේ නිලධාරීන් සඳහා වෙන් වූ කුටි මූලාසනයට විරුද්ධ දිශාවේ පිහිටා ඇත.

සභා ගර්භය දෙපස පුළුල් ආලින්ද පිහිටා ඇත්තේ, ඒ ඔස්සේ මන්ත්‍රීවරුන් සභා ගැබට ඇතුළුවීමට හා පිටවීමටයි. මන්ත්‍රීවරුන්හට අසුන් ගෙන සුහද සාකච්ඡාවල යෙදීම සඳහා මෙම ආලින්දයන්හි සුවපහසු ආසන සහ කාලෝචිත පරිදි අවශ්‍ය අනිකුත් උපකරණ සපයා තිබේ.

දිනමිණ බදා 1982 ක්‍රි.ව. අප්‍රේල් මස 29 වැනි

# අද විවෘත වන නව මැති සබයට

# එතෙරින් සුබ පැතුම්

## ඇමෙරිකා උප ජනපතිගෙන්

## කථානායකගෙන්

## බ්‍රිතාන්‍ය කථානායකගෙන්





## කෝට්ටේ පුරාවිද්‍යා ප්‍රදර්ශනය අද විවෘත වේ

# අද වැඩ සටහන

## උත්තමාචාර

## ප්‍රථම රැස්වීම


**ජය බිමෙන් නව යුගයක්**

**1982 අප්‍රේල් මස 29 වන දින**

**දිනමිණ පුවත්පතේ පුවත්**

පුවත් හසුනට සකස් කළේ - සියාද් අහමඩ්

# ජෙෆ්‍රි බාවා : නිවර්තන නූතනවාදයේ පුරෝගාමී සලකුණ



**- නිපුනි බලගමගේ -**

*මහජන සේවා නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**1919 ජුලි 23 වැනි දා ජන්ම ලාභය ලත් ජෙෆ්‍රි බාවා මහතා ලාංකික හා යුරෝපීය මුසුවකින් හෙබි, අති සාර්ථක නීතිඥ පවුලක දෙවැනි පුත්‍රයාය. පවුලේ සම්ප්‍රදායට අනුගතව, නිසිකල් පිරුණු විට බාවා දෙසොයුරන්ද නීතිය උගැන්ම සඳහා ලන්ඩනයට පිටත් කර හැරිණි. බැරිස්ටර්වරයකු ව සියරට පැමිණි බාවා සිය මවගේ අභාවයෙන් අනතුරුව දීර්ඝ ලෝක සවාරියක නිරතව, ඉතාලියේ පදිංචි වීමට සැලසුම් කරමින් සිටි නමුත්, ඉතාලිය වෙනුවට ජීවිතය ඔහුට තෝරා දුන්නේ දකුණු ලක මුහුදු තීරයට ආසන්න අදටත් මනරම් බිම් කඩක් වූ ලුණුගඟයි. ඉතාලියානු උයනක් සේ නිමැවූ ලුණුගඟ පෙදෙස පසුකාලීනව ඔහුගේ බොහෝ නිර්මාණවල සැලසුම් ඇඳුණු, සිය සමීපතමයන් හා දිවි ගෙවූ බිම විය. ඒ ආනුභාවය කෙතෙක්ද යත්, ලුණුගඟ අදත් සැලකෙන්නේ ආසියාවේ පිහිටි හොඳම උද්‍යානයක් ලෙසිනි.**

ලුණුගඟ සිට ගෘහනිර්මාණයට යොමුවුවද තමන් මුහුණ දෙන තාක්ෂණික ගැටලු මඟහැරීමේ අන් මගක් නොවුණෙන්, 1956 දී බාවා ලන්ඩන් ගෘහනිර්මාණ ශිල්පී සංගමයේ ඩිප්ලෝමාව ලබාගත්තේය. පසුව 1957 වර්ෂයේදී බ්‍රිතාන්‍ය රාජකීය ගෘහ නිර්මාණ ශිල්පී සංගමයෙන් සාමාජිකත්වය ලැබූ හෙතෙම සිය කණ්ඩායමේ හුන් වයස්ගතම, උසම මෙන්ම ධනවත්ම සිසුවාද වූයේය. 1969 වර්ෂයේදී ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පි සංගමයේ සභාපතිපති ධුරයට පත් බාවා විවිධ සමාගම් සමඟද තනිවමද භාරගත් බාවාගේ අනේක විධ ගෘහනිර්මාණ ව්‍යාපෘතිවල  මූලික සැකසුම් අදත් ලුණුගඟ දී ඔබට නිරීක්ෂණය කළ හැකිය.

වර්තමාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නිර්මාණය සඳහා ජෙෆ්‍රි බාවා මහතාට  ඇරැයුම් ලැබෙන්නේ, සිය පාසලේ ආදී සිසුවෙකු වන මෙරට පළමු විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා වෙතිනි. ඊට පූර්වයෙන් පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල පිහිටියේ මෙරටට පිටුපා, ගාලුමුවදොර දෙසින් නැගෙන හිරු නොබසින අධිරාජ්‍යයට මුහුණපාමිනි. හුදෙකලා ව නැගී සිටි ගම්භීර ගොඩනැගිල්ලක් පාර්ලිමේන්තුව ලෙස භාවිතයට ගැනුණද එහි දක්නට ලැබුණේ, යුරෝපීය ගෘහ නිර්මාණ ලක්ෂණය. එනමුත්, ජෙෆ්‍රි බාවා වත්මන් පාර්ලිමේන්තුව ගොඩනැගූයේ, නන්විධ ලාංකික ගෘහනිර්මාණ හා පෙරදිග සංස්කෘතික ලක්ෂණ සුසංයෝගයෙනි.

විවෘත ප්‍රවේශ මාර්ගවලින් පැමිණෙන මහජනයාට සිය දුක් ගැනවිලි කියනු පිණිස මෙම පාර්ලිමේන්තුව නිමැවීමට බාවා ට උවමනාව තිබිණි. ජෙෆ්‍රි බාවා මෙන්ම ලකී සේනානායක, ආචාර්ය මංජු ශ්‍රී, ඊනාද සිල්වා, ආචාර්ය විමල සුරේන්ද්‍ර වැනි දේශජ කලා ශිල්පයන්හි පරතෙරට ගිය කලා නිර්මාණ ශිල්පීන්ගේ දායකත්වයෙන් ගොඩනැගුණු ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ගොඩනැගිල්ල අදටත් සැලකෙනුයේ, හරිතමය සංකල්පයෙන් නිර්මිත ලොව ආකර්ෂණීය පාර්ලිමේන්තු ගොඩනැගිලි සංකීර්ණයක් ලෙසය. එබැවින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ගොඩනැංවීමේදී ජෙෆ්‍රි බාවා මහතාගේ විශිෂ්ට ශක්‍යතාවන් මෙන්ම අනෙකුත් නිර්මාණ ශිල්පීන්ගේ කෞශල්‍යයන්ද මෙහි සුවිශේෂයෙන් සිහිපත් කළ යුතුම වේ.

මනස්කාන්ත අල්ලි මෝස්තරයකින් හෙබි පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරයට පිවිසෙන ප්‍රවේශ ශාලාවෙහි සිවිලිම සිත්තම් කර ඇත්තේ මෙරට ප්‍රකට බතික් නිර්මාණ ශිල්පිනියක් මෙන් ම ජෙෆ්‍රි බාවාගේ හිතවත් මිතුරියක ද වූ ඊනා ද සිල්වා මහත්මියගේ සිත්තමකිනි.

ප්‍රධාන ද්වාරයේ සිට සභාගර්භයට පිවිසෙන බිත්ති සැරසී ඇත්තේ ආචාර්ය මංජු ශ්‍රී සූරීන්ගේ සිත්තමකිනි. සැලළිහිණි සංදේශයේ මනරම් අවස්ථාවන් කිහිපයක් මෙන්ම සතරවරම් දෙවිවරුගේ සිත්තම් සභාගැබට ශෝභාසම්පන්න බවක් එක්කරන අතර බිතු සිතුවම් සඳහා ආචාර්ය මංජු ශ්‍රී යොදා ගෙන ඇත්තේ අඛණ්ඩ කථන ශෛලියයි. හෙළ කලා ශිල්පයන් හා පුරාණ ශ්‍රී ලංකාවේ කලා සම්ප්‍රදාය ප්‍රකට වන අයුරින් සභාගැබට පිවිසෙන ද්වාරය නිමවා ඇත්තේ, ලෝහ මූර්ති ශිල්පී විමල සුරේන්ද්‍රයන් විසිනි.

සභාගැබ මැද දිදුළන්නේ නිර්මාණ ශිල්පී ලකී සේනානායකයන්ගේ නිමැවුමක් වන තල් ගසක කරටියක සොබා රූ ගත් යෝධ පොකුරු පහනකි. මේ හැර, අනිල් ගාමිණී ජයසූරිය, මහින්ද අබේසේකරයන් වැනි ශිල්පීන්ගේ කුසලතාවන් ද ජෙෆ්‍රි බාවාගේ සිතෙහි ඇඳි පාර්ලිමේන්තුවේ සිතුවම පරිපූර්ණ කිරීමට අදටත් දායක වෙනු සමත්ය.

මෙරට ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය විදහා දක්වනු සමත්, පරිසර හිතකාමී සංකල්පයකින් යුතු ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ගොඩනැගිල්ල මෙන්ම ගංගාරාමයේ සීමාමාලකය, ස්වභාවික පරිසරය විනාශ නොකර නිර්මිත රුහුණු විශ්වවිද්‍යාලය, ඊනා ද සිල්වාගේ නිවස, නිල්වලා අධ්‍යාපන විද්‍යාපීඨය, කණ්ඩලම හෝටලය ඇතුළු ගොඩනැගිලි සහ ගෘහයන් නිර්මාණයෙන් බාවාගේ කීර්ති කදම්භය දෙස් විදෙස් පතළ වූයේ ඔහු තුළ පැවති නෛසර්ගික හැකියාව නිසා බවද සිහිපත් කළ යුතුය. 1985 වර්ෂයේදී විද්‍යා ජෝති ගෞරව නාමයෙන්ද, 1993 වර්ෂයේදී දේශමාන්‍ය ගෞරව නාමයෙන්ද පිදුම් ලැබූ දෙස් විදෙස් කීර්තිධර ජෙෆ්‍රි බාවා නම් සොඳුරු මිනිසා අදට ද සැලකෙන්නේ 20 වැනි සියවසේ වඩාත්ම වැදගත් සහ ආනුභාව සම්පන්න ආසියානු ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙසය.

# පැරණි පාර්ලිමේන්තුවේ පළමු කථානායක ආසනයේ කථාව



පැරණි පාර්ලිමේන්තුවේ කථානායක අසුන ලෙස භාවිත කළ මෙය 1949 ජනවාරි මස 11 වැනි දින ලංකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත මහා බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් ත්‍යාගයක් වශයෙන් හිමිවිය.

මහා බ්‍රිතාන්‍යයේ 6 වන ජෝර්ජ් රජතුමාණන්ගේ එකඟත්වය ඇතිව, මහජන මන්ත්‍රී මණ්ඩලයේ මහාමාන්‍ය මේජර් මිල්නර් මැතිතුමාගේ නායකත්වයෙන් යුත් සය දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක්, එම ආසනය තෑගි කිරීමේ උළෙලට සහභාගී වීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණියහ. ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ කථානායකතුමා විසින් එම ආසනය භාර ගන්නා ලදී.

දෙවැනි ලෝක යුද්ධය සමයේ ජර්මනිය විසින් බෝම්බ හෙළීම නිසා අර්ධ වශයෙන් විනාශ වී ගිය මහා බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ, නියම ඉංග්‍රීසි ඕක් දැවයෙන් තනා තිබුණු බාල්කයක කොටසකින් මෙය තනා ඇත. අඩි 6 ක් උස මෙම අසුනේ පත්‍ර හැඩයට කැටයම් කපා ඇති අතර, ඒවා රනින් ඔප දමා ඇත. තද දම් පැහැයට හුරු සම් ආවරණයෙන් ආසනයේ කුලිච්චම (කුෂන්) සැකසී ඇති අතර, අසුනේ ශීර්ෂය යට ඇති සම් ආවරණයෙහි ඔබ්බවන ලද කඩුවක් අමෝරා සිටින සිංහයකුගේ රූපය රන් පැහැයෙන් පුරවා සකස් කර ඇත.



# ප්‍රජාතන්ත්‍රවාදයේ දෘශ්‍යමය අභිෂේකය; ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

- රිශ්මියා නූටාන් -
මහජන සේවා නිලධාරී - සන්නිවේදන දෙපාර්තමේන්තුව

> "අපි අපේ ගොඩනැගිලිවල හැඩය නිර්ණය කරමු. ඉන්පසු ගොඩනැගිලි අපගේ හැඩය නිර්ණය කරනු ඇත"
>
> - වින්ස්ටන් චර්චිල් -

ප්‍රාචීනත්වය හා ප්‍රතිචීනත්වය සිහි ගැන්වෙන සංකලනයකින් යුතු දෘශ්‍යමය සාක්ෂිවලින් හෙබි ශ්‍රී ලංකාව වැනි පශ්චාත් යටත්විජිත රාජ්‍යයක, පාර්ලිමේන්තුව වැනි නිර්මාණයක් ඉදිකරන ගෘහනිර්මාණ ශිල්පියෙකුට සංකීර්ණතා රැසකට මුහුණ පෑමට සිදු වෙයි. එයට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ යටත්විජිතකරණයත් සමඟම දේශීය ගතානුගතික සිරිත් - විරිත් හා බටහිර නව්‍ය සිරිත් - විරිත් ද සම්මිශ්‍රණය වීමයි. එක් සංස්කෘතික කණ්ඩායමකට අනෙකා පරයා නැගී සිටිය නොහැකි වන පරිදි සැලසුම්කරණය ද අසල්වැසි රාජ්‍යයන්හි ඉදිකරන ලද පාර්ලිමේන්තු සංකීර්ණයන් වල ආකෘතීන්ට වඩා වෙනස් වූ සැලසුමක් සහිත වීමද මෙහිදී වැදගත් වේ.

ඕනෑම රාජ්‍යයක් සිය රාජ්‍ය ගොඩනැගිලි නිර්මාණය කිරීමේදී "ජාතික අනන්‍යතාවයක්" පිළිබිඹු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ආකාරයක් පෙනී යයි. වෙසෙසින්ම, පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් යනු අනාගතයේ බොහෝ භාරදූර කර්තව්‍යයන් සිදුවෙන ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වන නිසා එහි බාහිර ස්වරූපය මෙන්ම ආයතනික ක්‍රියාකාරීත්වයද එක හා සමානව රටකට වැදගත් බව ගෘහ නිර්මාණ ශිල්පියා වටහා ගැනීම අත්‍යාවශ්‍ය වේ.


යටත්විජිත සමයේ ඉදිකරන ලද පරණ පාර්ලිමේන්තු ගොඩනැගිල්ල යුරෝපීය පුනරුද යුගය සිහිගන්වන අතර එම වාස්තු විද්‍යා ලක්ෂණ ද ඉස්මතු කරයි. එහෙයින් දේශීයත්වයට වඩාත් නැඹුරු එමෙන්ම වැඩි ඉඩ ප්‍රමාණයක් සහිත නව පාර්ලිමේන්තු සංකීර්ණයක් ඉදිකිරීමේ අවශ්‍යතාවය ඉස්මතු විය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පී ජෙෆ්රි බාවා විසින් නිර්මාණය කරන ලද නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, ගෘහ නිර්මාණ ශිල්පය තුළින් රට තුළ පැවති ජනවාර්ගික ගැටුම් සම්පූර්ණයෙන් විසඳා ගත නොහැකි වුවද, යම්තාක් දුරකට එම අර්බුද සඳහා යහපත් විසඳුම් ලබාදීමට මෙම ශිල්පීය ක්‍රමය යොදා ගැනීම දේශපාලනික ක්‍රියාමාර්ගයන්ට වඩා ඵලදායී බව මනාව පෙන්වා දෙයි.

මක්නිසාද යත්, එය ජනවර්ග කිහිපයක සම්මුතියක් මඟින් ගොඩනැගුණු බවට ඉතිහාසය සාක්ෂි සපයයි. එනම් ජෙෆ්රි බාවා (ඇන්ග්ලෝ මුස්ලිම් ජාතික), එඩ්වඩ්, රීඩ් සහ බෙග් (බර්ගර් ජාතික), ආචාර්ය කේ. පූලෝගසුන්දරම් (දමිළ ජාතික) සහ වසන්තා ජේකොබ්සන් - චන්ද්‍රරත්න (සිංහල ජාතික) යන ශිල්පීය මඬුල්ලේ සම දායකත්වය තුළින් නව ලාංකීය පාර්ලිමේන්තු ගොඩනැගිල්ල නිර්මාණය කෙරිණි.



*ජෙෆ්රි බාවා*



*එඩ්වඩ්, රීඩ් සහ බෙග්*



ARCHITECTS AND ENGINEERS
EDWARDS REID AND BEGG
GEOFFREY BAWA
DR K POOLOGASUNDRAM
VASANTHA JAKOBSEN
CONTRACTOR
MITSUI & CO
MITSUI CONSTRUCTION CO

*පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට කාවද්දන ලද ශෛලමය ඵලකය*

එය පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට කාවද්දන ලද ශෛලමය ඵලකයෙන්ද මනාව ප්‍රකට වේ. එමෙන්ම, පාර්ලිමේන්තුව මහජනයා වෙත සමීප කිරීමේ අරමුණෙන් පාර්ලිමේන්තු පරිශ්‍රයේ ලාංකීය පැරණි ගෘහ නිර්මාණ ශිල්පක්‍රම අතර



වන 'අම්බලම' යන සංකල්පය හුවා දක්වමින් ස්ථාන කිහිපයක් ඉදිකිරීම එක් පසෙකින් ප්‍රජාතන්ත්‍රවාදය විද්‍යමාන කරයි. මක්නිසාද යත්, එම ස්ථාන මහජන නියෝජිතයින් සහ ඔවුන් නියෝජනය කරන ප්‍රදේශයන්හි පුරවැසියන් එක් රැස් වී සුහද කතාබහක නිරත වීමේ අරමුණින් ඉදිකරන ලද බව ප්‍රකට කරුණකි.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සුවිශේෂ ගෘහ නිර්මාණ ලක්ෂණ**

- වර්තමානය වන විට අතිශය ජනප්‍රිය සංකල්පයක්ව පවතින පරිසර හිතවාදී හරිතමය බව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නිර්මාණය කරන 80 දශකයෙහි මුල්භාග යේදී නව සංකල්පයක් ලෙස සැලකිණි. වර්තමානයේද ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පරිශ්‍රයෙහි දක්නට ලැබෙන මෙම පරිසර හිතකාමී බව එහි සුවිශේෂ ලක්ෂණයක් සේ ගෘහ නිර්මාණකරණයේදී ඇගයීමට පාත්‍ර වෙයි.

- ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයෙන් වටවූ ස්වභාවික දිවයිනකි. පාර්ලිමේන්තුව යනු මෙරට මහජන නියෝජිතයන් හමුවන කේන්ද්‍රස්ථානයයි. එම සංකල්ප ද්වයම සංකේතවත් කරමින් මෙරට ව්‍යවස්ථාදායකය පිහිටි පාර්ලිමේන්තු අංගණයද පිහිටියේ, දියවන්නා ඔයෙන් වටවුණු කුඩා බිම්කඩක් පසු කලෙක මිනිස් ශ්‍රමයෙන් දූපතක් බවට පත්කිරීමෙනි.

- ලංකා ඉතිහාසය අධ්‍යයනයේදී පෙනී යන්නේ මෙරට ගෘහ නිර්මාණ ශිල්පීය සැලසුම් එකිනෙකට වෙනස්, සංකීර්ණ සහ අලංකෘත ගෘහ නිර්මාණ ශිල්පයන්හි සංකලනයක් බවයි. එවන් අතිශය උත්කර්ෂවත්, පෙරදිග ගොඩනැංවීම්වල ආභාසයෙන් නිමවූ මෙම නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල එක් ප්‍රධාන ශාලාවක් වටා කේන්ද්‍රගත වන පංචවාස ගෘහනිර්මාණ සැලසුමක් වීම තවත් අපූර්වතම ලක්ෂණයකි.

- පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙහි තවත් සුවිසෙස් අංගයක් වනුයේ, මහනුවර රාජසිංහ රජුගේ දළදා මාළිගයට මෙන්ම ලංකාතිලක විහාරයේ වහළෙහි ආකෘතියටද සමීපතා පෙන්වන ලෝහමය වහළයි. තඹ ලෝහයෙන් තැනූ නිසා මුල් කාලයේ එම පැහැයෙන් යුක්තවූ මෙම වහළය පසුව සොබාදහම හා සම්මිශ්‍රණය වී කාලානුරූපීව හරිත පැහැයට පරිවර්තනය වී තිබේ.

- පාර්ලිමේන්තුවේ කේන්ද්‍රය වනුයේ මහජන නියෝජිතයන් ඒකරාශීව සංවාදයෙහි නියුතු වන සභාගැබයි. ජෙෆ්රි බාවාගේ සැලැස්මට අනුව, එහි ප්‍රධාන ගොඩනැගිල්ලේ පදනම සමචතුරස්‍රාකාර හැඩයක් ගන්නා නමුත් සභා ගැබේ ඉහළින් වන කූඩාරම් හැඩයේ රන් පැහැගත් සිවිලිම නිසා එය නව්‍යාකාරයේ, අපූරු හැඩතලයකට උරුමකම් කියයි.

- ගොඩනැගිල්ලේ සැලසුමට අනුව, සභාගර්භය සඳහා නූතන තාක්ෂණික මෙවලම්, ආලෝකය සහ ශබ්ද පරිපාලන උපරිම වශයෙන් එක්කර ගැනීමට සැලසුම්කරුවා සමත්ව සිටී. සභාගර්භයේ දැව නිර්මාණ සඳහා වුවද සියඹලා පදම් කළ ලී යොදාගැන්ම එවකට දේශීය ගෘහ නිර්මාණකරණයේ අතිශය නූතන මාදිලියේ තෝරාගැනීමක් වූ බව අවිවාදිතය.

නව රාජ්‍යයන් පෙන්වීමට උත්සාහ කරන ජාතික හා ජාත්‍යන්තර අනන්‍යතාවන්ට මුහුණ දීමට ඇති කැමැත්ත බාවාගේ මෙම නිර්මාණ කාර්යය මඟින් අතිවිශිෂ්ට ලෙස ප්‍රදර්ශනය වන හෙයින් ලොව අනෙක් පාර්ලිමේන්තු අතර මෙම නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල වඩාත් සිත්ගන්නාසුලු වේ. එය පෙර-පර දෙදිග බොහෝ යුගවල වාස්තු විද්‍යාත්මක විවිධත්වයන්හි සම්මිශ්‍රණයක් ලෙසද අර්ථ දැක්විය හැකිය. අදටත් ලොව නන්දෙසින් නරඹන්නන් මෙන්ම ගෘහ නිර්මාණ ශිල්පීන්ද මෙම ස්ථානයට නිරන්තරයෙන්ම ඇදී එන්නේ, ජෙෆ්රි බාවාගේ අතිවිශිෂ්ට, නිවර්තන, නූතනවාදී ශෛලියෙන් පොහොසත් වූ අභියෝගාත්මක නිමැවුමෙන් දෘශ්‍යමාන වන අද්විතීය ජාතික අනන්‍යතාව අගයනු පිණිසය.

> "ගෘහ නිර්මාණ ශිල්පය සම්පූර්ණයෙන්ම පැහැදිලි කළ නොහැකි නමුත් අත්විඳිය යුතුය"
>
> - ජෙෆ්රි බාවා -






# පැරණි පාර්ලිමේන්තුවේ දෙවන කථානායක අසුන

පැරණි පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ මෙම කථානායක අසුන, ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ සහ ගරු අල්හාජ් එම්. ඒ. අබ්දුල් බාකීර් මාකර් යන කථානායකවරුන් විසින් භාවිත කරන ලදී.

මෙම අසුන සිරකරුවන් විසින් නිර්මාණය කර කැටයම් කරන ලද්දක් වන අතර, 1952 වසරේ දී බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තුවට බාර දී ඇත. කළුවර දැවයෙන් තැනුණු මෙම අසුනෙහි උස අඩි පහකි. අසුනේ ඉහළ කොටසෙහි රාජ්‍ය ලාංඡනය සවි කර ඇත. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන ඔබට මෙය දැකබලා ගැනීමේ හැකියාව ඇත.



# පොකුරු පහනේ පුරාවත



පාර්ලිමේන්තු සභා ගර්භයේ සිවිලිම කූඩාරමක හැඩයෙන් යුතුව නිර්මාණය කොට ඇත. ඒ සමචතුරස්‍රාකාර හැඩයෙන් යුතු මල නොබැඳෙන වානේ තහඩු යොදා ගනිමිනි. ඒ එම එක් එක් තහඩු කොටු තඹ කොකු යොදා ගනිමින් සිවිලිමට සවිකොට ඇත.

සභාගර්භය තුළ ස්ථානගත කොට ඇති සෑම විදුලි පහනක්ම මෙම සිවිලිම දෙසට යොමුකොට ඇති අතර, මෙම සිවිලිම උපයෝගී කොට ගනිමින් එකී ආලෝකය පරාවර්තනය කොට සභාගර්භය වෙත ලබා දීම මෙහි ඇති සුවිශේෂීත්වයයි.

සභාගර්භය මධ්‍යයයේ ඇති රිදී සහ තඹ උපයෝගීකොටගෙන නිර්මාණය කරන ලද යෝධ පොකුරු පහන සභාගර්භය අලංකෘත කිරීම සඳහා ලකී සේනානායක මහතා විසින් නිර්මාණය කරන ලද්දකි.

යෝධ පොකුරු පහනේ සෑම ශාඛාවකම අන්තර්ගතකොට ඇති විදුලි පහන් සභා ගර්භයට මෘදු ආලෝකයක්ද ලබා දේ.

# Memories of four decades (40 years) of Parliament life


- Narendra Fernando -

*Serjeant – at – Arms*




***I am indeed glad to contribute this Article to the special edition of Parliament Newsletter to be published in commemoration of the 40 years of the new Parliamentary Complex at Sri Jayewardenepura Kotte which fell on 29th April 2022. I wish to scribble a few of the following golden memories which I experienced during my two thirds of life in Parliament.***

I am the 6th Serjeant – at – Arms in Parliament. I had served in the Parliament Committees, Bills, Table, Supplies and Services, International Relations and Protocol Offices during my tenure in the Administration Department from December 1981 to 2000 having climbed up to the position of the Assistant Director (Administration). In January 2001, I was appointed as the Assistant Serjeant – at – Arms and elevated to the Post of Deputy Serjeant – at – Arms in March 1996 and to the post of Serjeant – at – Arms in September 2018. I have participated in the Attachment Programmes to study the Parliamentary Practices and Procedure, Conference organizing process, functions relating to the Post of Serjeant – at – Arms etc., House of Commons London, UK, in the House of Representatives, Canberra Australia and in the Lok Sabha New Delhi India. I am the most senior employee at present in this Parliament, with 40 years of service. Apart from that I am privileged to be the only officer who had worked in the old and the new Parliament buildings. Out of the Members in the present Parliament, Hon. R. Sampanthan is the only member who represented the Parliament at the time of opening of the New Parliament. Hon. Sampanthan, Hon. Vasudeva Nanayakkara, Hon. Minister Mahinda Rajapaksa and the Hon. Ranil Wickremesinghe had the privilege to serve in the old and the new Parliament.




Having joined the Committee Office of the Administration Department as a Grade II Clerk in December 1981 for an all-inclusive salary of approximately Rs. 750/-, I performed a substantive role in the shifting activities from Old Parliament at Colombo to the New Parliament at Sri Jayewardenepura Kotte in March/ April 1982.

The Parliament was ceremoniously declared opened by the late HE J. R. Jayewardene then Executive President, at 10.28 a. m. on 29th April 1982. During that period, Parliament under the Secretary General of Parliament, there were only three departments, i.e., Serjeant – at – Arms, Administration (then under Administrative Assistant) and Hansard, where the entire strength of staff was little over 100. With the escalation of Parliament work several new departments







were established from time to time such as department of Catering and Housekeeping, Coordinating Engineer, Finance and Supplies, Legislative Services, Information Systems and Management, Communications and at present there are 9 such departments with 835 Parliament staff working under those departments.

The task of organizing the Ceremonial Opening of the Parliament was entrusted with the Committee Office where late Mr. Kingsley Karunathilake was the Principle Officer by the then Secretary General Mr. Nihal Seneviratne as the Serjeant – at – Arms, Department lacked officers and had only 3 of them i.e., SA the ASA and another subordinate officer. Post of DSA was created in 1980s. Since I was attached to the Committee Office, I had the privilege to contribute to this major task along with my other Colleagues, i.e., Messrs.' late S. M. C. B. Sakalasooriya, Wijaya Palliyaguruge (both had the privilege to be the Director Administration and the Serjeant – at – Arms respectively in their latter part of the career) S. D. Jayasekara, H. L Ariyarathne, Jagath Gajaweeraarachchige, late K. Sabanayagam and few others. Our team received commendations from the then HE, the PM, the HS and other distinguished visitors for the meticulous manner in which the ceremony was organized. All those dynamic officers ended their career in executive levels including myself as the incumbent Serjeant – at – Arms, and Jagath as the retired Director (Legislative Services). Other than Messrs. Karunathilake, Sakalasooriya, Sabanayagam all the others referred to above are among the living.

I had the opportunity to participate in TV interviews, educational and entertainment programs in almost all local TV stations and FM programs in the SLBC which provided me an opportunity to enlighten public on the Parliamentary System and the Role of the Serjeant – at – Arms, etc.

> *"I take this pride to state that I have had the privilege to work under ten Speakers viz. Late Hon. Abdul Bakeer Markar; Late Hon. E. L. Senanayake; Late Hon. M. H. Mohamed; Late Hon. K. B. Ratnayake; Late Hon. Anura Bandaranaike; Hon. M. Joseph Michael Perera; Late Hon. W. J. M. Lokubandara; Hon. Chamal Rajapaksa; Hon. Karu Jayasuriya; Hon. Mahinda Yapa Abeywardena..."*

I take this pride to state that I have had the privilege to work under ten Speakers viz. Late Hon. Abdul Bakeer Markar; Late Hon. E. L. Senanayake; Late Hon. M. H. Mohamed; Late Hon. K. B. Ratnayake; Late Hon. Anura Bandaranaike; Hon. M. Joseph Michael Perera; Late Hon. W. J. M. Lokubandara; Hon. Chamal Rajapaksa; Hon. Karu Jayasuriya; Hon. Mahinda Yapa Abeywardena, and five Secretaries General of the Parliament viz. Mr. S. N. Seneviratne; Late Mr. Bertram Tittawella; Mr. Dhammika Kitulgoda; Mrs. Priyanee Wijesekera; Mr. Dhammika Dasanayake and also under several Governments viz. HE Late J. R. Jayewardene; HE Late Ranasinghe Premadasa; HE Late D. B. Wijetunga; HE Chandrika Bandaranaike










Kumaratunga; HE Mahinda Rajapaksa; HE Maithripala Sirisena; HE Gotabaya Rajapaksa during my 40 years career.

I could still recollect the following incidents and the challenges faced in my career.

1. Grenade attack in the Committee Room 1 on 18th August 1987 around 9.00 a. m. I wish to share a horrendous experience faced by me on this day. In addition to the work in my substantive post in the Committee Office as the Committee Officer, I was in-charge of the Overseas and Protocol Office and the Speaker 's Office in Parliament, having appointed me as the Personal Assistant to the then Speaker late Hon. E. L. Senanayake at his request by the Staff Advisory Committee with an additional allowance. As soon as the blast occurred, I took immediate action to stop the movement of the Hon. Speaker from coming to the Parliament to preside the Parliament Sittings on that day, and went in search of the then Deputy Speaker, late Hon. Norman Waidyarathne, who was there at the Government group Meeting. Having explained him the situation, I took him to preside the Sitting on that day which lasted only for a few minutes, consequent to this unfortunate incident.

2. It reminds me the Challenge I took in the absence of my superiors on the day the late President R. Premadasa was assassinated on 1st May 1993. I, with the support of a few staff members, made all arrangements to convene the Parliament Sittings on 7th May 1993 to elect a new President under the provisions in the Presidential Elections Act No. 15 of 1981.

3. Floods occurred on 5th June 1992 and on 10th November 2010.

   As a result of the massive rainfall of 493.03 mm within a short period of time, the Committee Room 1 and 2 in the Parliament got inundated due to the floods in 1992. During this time Parliament was making arrangements to host the opening ceremony of the SAARC Speakers' Conference in the Committee Room 1 of Parliament on 15th June 1992. I was the Conference Coordinator and with the support of our staff, especially the House keeping staff and the engineering staff, managed to host this event in spite of that flood. This was another challenge faced by me during my career.





In the floods occurred in 2010 where it recorded a rainfall of 440.02 mm within a short time, the entire ground floor got flooded. I was the Deputy Serjeant – at – Arms at that time. I received a call from Parliament Police around 1.30 am on this day to this effect and soon myself and my predecessor Mr. Anil Samarasekara and a few officers rushed to Parliament. At this time the surrounding was about one foot under water. We managed to reach the Public Entrance in one of our large buses and walked across the flooded water to the building and took immediate action to move the valuable items, books etc, to the higher elevations with the help of Parliament Police Officers and the staff on duty in the CEB and Water Board substation and

managed to save millions of worth properties. The Sitting of this day was conducted under lamplight for about 7 minutes as the power supply was disconnected. A few number of Members were brought to Parliament in Army Buffels to maintain the Quorum of the House which is 20 Members. We took the "Mace", the Symbol of Authority in Parliament, to the 1st floor and changed our uniforms in one of the Minister's Rooms.

"The Sitting of this day was conducted under lamplight for about 7 minutes as the power supply was disconnected..."

4. Another horrendous experience I faced was the emergency landing in Kothmale area of the Air force Bell Aircraft during the height of insurgency period, which was carrying the British Parliamentary Delegation with myself on board, my colleague Jayasekera and the PSO Manage were also with me. We safely landed and managed to travel to Colombo in the same air craft upon rectifying the petrol block.

5. On 3rd June 2003, a coffin and a flower wreath were brought to the Chamber and my Serjeant, Deputy and myself tried our best to prevent that attempt, but failed as there were a large group of MPP. We had to make number of statements to the CID which conducted an inquiry into that incident at the request of the then Speaker Hon. Joseph Michel Perera.

6. The two incidents that a government MP grabbed the Mace and ran to the lobby area on 08th June 2004 and by an opposition MP on 22nd February 2007 come to my mind. The Serjeants managed to recover the Mace without any damage on both occasions.

7. Other memories, which come to my mind, in brief, which I experienced while performing my duties are as follows;

a) On the 7th December 2004, pelting of a water glass towards the Chair by late Hon. T. Maheshwaran, MP.

b) Prevention of the procession carrying the Mace by the TNA MPP from May – June 2005 by forming lines in the well of the House. The Mace was brought in from the Lobbies and the Speaker entered from the side doors behind the Speaker's Chair. On one sitting day Hon. Speaker and the procession reached the Chair through the Government Benches.

c) On 20 April 2015, a group of opposition members spent sleepless nights in the Chamber by force.

d) In 2005, throwing of a plastic bottle of water from government side to the opposite side by Sarana Gunawardhana, former MP, which landed in the middle of the Well of the House, which created a splash spreading drops at the Prime Minister. The MP was suspended for one week.

e) Removal of Hon. Dinesh Gunawardane MP from the House on 8th March 2017, which was the Worlds Women's Day. As women MPP provided protection and prevented removal, Serjeants refrained from performing their duty in view of the Women's Day and negotiated instead and calm down the situation by persuading Hon. Gunawardane to leave the Complex.

f) On the 16th November 2018, incidents in the Chamber

Conducting the Parliament Session on this day with the assistance of the Police as the group of MPP surrounded the Speaker's Chair and the Secretaries table including the rack where "Mace" is kept. The Parliament Sessions were held according to the plan initiated and executed by me, which went

viral locally and internationally. This was the toughest experience and most strenuous period ever experienced by me and the memories of same are still discussed in various forums even now.

g) In 2018 opening of the side doors on either side on the Silver Door to bring in MPP for Oath taking and to facilitate the bringing in of strangers for questioning to the chamber if need arises, vide the provisions of the Parliamentary Powers and Privileges Act. With that procedure, the previous arrangement for the MP to be seated in the Chamber before taking the Oath was done away with, on a proposal made by me.

h) Election of the Speaker, late Hon, W. J. M. Lokubandara which lasted a marathon of 8 hours approximately and related incidents.

i) Prevention of taking the Oaths by Rev. Akmeemana Dayarathna Thero in the Parliament by a group of MPP and the injury sustained by Rev. Kolonnawe Sumangala Thero, MP in the melee.

j) Burning of the draft Constitution inside the Chamber by an Opposition MP, in 2000.

k) Conducting the Parliament Sittings, while the Chamber/ lobby doors are opened for the first time in the history due to the Covid-19 pandemic crisis,

l) The precautionary measures taken by myself and my able team to manage and prevent the Covid19 pandemic in the Parliamentary Complex by duly vaccinating the staff with the 3 jabs and the PCR/ Rapid Antigen programs carried out in regular intervals to this date, Ayurveda treatment and accommodation facilities with the assistance of the Department of Ayurveda. Parliament functioned and Sittings conducted without any closure or interruption.

m) The Joint Security Operation conducted in the Parliamentary Complex under my guidance for the first time in the history at the Parliament on 14th July 2020 and the new security measures with new technology adopted to strengthen Parliament Security system, w. e. f. September 2018.

n) Overnight Sessions conducted till the dawn of the following day to pass the 6th Amendment to the Constitution and the withdrawal of the Tamil MPP from Parliament consequent to that.

I end this account with my deep gratitude and sincere thanks to Mr. Nihal Seneviratne, former Secretary General for selecting me to the Parliament Staff. Mr. Dhammika Kithulgoda for facilitating me to apply for the Post of Assistant Serjeant -at – Arms, Mr. Dhammika Dassanayake for appointing me as the Serjeant -at – Arms. I have proved to all of them that my selections were not wrong. I worked dedicatedly and always acted in an impartial and neutral manner in order to uphold the standards of the ethics in parliamentary practice.



Sri Lanka where the oldest democracy exists in the South East Asia, celebrates the 75 years of Parliamentary Democracy. Long live the Parliamentary Democracy and the Parliamentary System in our motherland.


# සෙංකෝලය



**බොහෝ රටවල පාර්ලිමේන්තුවේ ද, පාර්ලිමේන්තුව තුළ කථානායකවරයාගේ බලාධිකාරයෙහි ද සංකේතය, සෙංකෝලයයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අනුව ද යම් පාර්ලිමේන්තු රැස්වීමක් වලංගු වීම සඳහා අදාළ අවස්ථාවේදී සෙංකෝලය පාර්ලිමේන්තුවේ තිබීම අත්‍යවශ්‍ය වේ.**

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුදත් වර්තමාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ද රැස්වීමක කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීම පිණිස, සෙංකෝලය උරින් දරාගත් වේත්‍රධාරී ප්‍රමුඛ කථානායකතුමන්, පාර්ලිමේන්තු ලේකම්වරුන් සමඟ පෙරහරින් සභාගැබට පිවිස, එය තැන්පත් කිරීම සඳහා ඊටම වෙන්වූ ආධාරකයෙහි රැඳවීම අනිවාර්ය වේ. ඔබ දකින මේ සෙංකෝලය ජෙරාඩ් සමාගම මඟින් නිමවා, බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් 1949 දී ලංකාවට ප්‍රදානය කරන ලදී. ලාංකේය සංස්කෘතික අනන්‍යතාවය සෙංකෝලයට එක් කළේ, එහි ආකෘතිය නිමවූයේ එවකට රජයේ ලලිත කලායතනයේ ආචාර්ය එස්. පී. චාල්ස් මහතා විසිනි.

එසේ නිමවූ සෙංකෝලයේ බර රාත්තල් 28ක් හෙවත් කි.ග්‍රෑ. 12.5 ක් වන අතර එය දිගින් අඟල් 48 ක් වේ. සෙංකෝලය නිමැවුමෙහි සංකල්පීය අර්ථය පෙරදිග සෞන්දර්යයේ සංකේතය වන නෙළුම් මල මූලික කර ගත්තකි. රිදියෙන්, කැරට් 18 රනින් හා නීල මාණික්‍යයෙන් සරසා ඇති කළුවර දැවමය යෂ්ටිය අඟල් 28ක් දිගය. එහි පහත කොටස රනින් හා රිදියෙන් නිම කළ පෙති දොළොසක යටිකුරු නෙළුම් මලකි. කළුවර ලී කොටස මුදුනතෙහි, පැති අටකින් යුත් රිදීමය කුළුණු හිසකින් සමන්විතය.



ඊට ඉහළින් පෘථිවියේ සතර දිශා සංකේතවත් කරන නෙළුම් මලේ හැඩය ගත් රිදියෙන් හා කැරට් 18 රනින් කළ ජේකඩ සතරකි. ඊට සම්බන්ධ වන්නේ මනස්කාන්ත සිව්රුස් ඝනකයකි. එහි සතර පැති සදාතනිකත්වය සංකේත කරමින් හිරු, සඳු ද, ඉදිරි ගමන සංකේතවත් කරමින් චක්‍රයද, සෞභාග්‍යය දැක්වෙන පුන් කළසද දර්ශනීය ලෙස කැටයම් කර තිබෙයි.

රනින්, රිදියෙන් සහ අගනා මාණික්‍යයෙන් සුසැදි, ඉසියුම් දේශජ කැටයමෙන් අලංකෘත මේ මාහැඟි සෙංකෝලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සැමවිටම පෙනී සිටින උත්තරීතර ප්‍රජාතන්ත්‍රවාදයේ පරම සංකේතයයි.

# අදටත් නව්‍යවාදී හරිතමය පාර්ලිමේන්තුව කරා අප ආ ගමන



**ඉෂාරා වික්‍රමසිංහ**

*මහජන සේවා නිලධාරී - සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**මෙරටට නූතන අගනුවරක් ද (capital) නූතන පාර්ලිමේන්තුවක් ද - පුරාණ අර්ථයෙන් නම් බලකොටුවක් ද (CAPITOL) ගොඩනැගීමේ අවශ්‍යතාව සඵල වන්නේ නිදහස ලැබී දශක ත්‍රිත්වයකින් අනතුරුව ජේ. ආර්. ජයවර්ධන ජනපති සමයේදීය.**

එනමුත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළමුවන පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කරන දින ජයවර්ධන ජනපතිවරයා සභාව ඇමතීමේදී ඉදිරිපත් කරන තොරතුරු අනුව අනාවරණය වනුයේ, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් 50ක් සඳහා සාදන ලද පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙහි මන්ත්‍රීවරයන් 200ක් අසුන් ගැන්වීම දුෂ්කර බව ඉංජිනේරුවරුන් කියා සිටි බැවින් නව ගොඩනැගිල්ලක් සෑදීම සම්බන්ධව ශ්‍රීමත් ඇල්බට් පීරිස් කථානායකවරයාගේ නායකත්වයෙන් යුතුව ප්‍රථමයෙන්ම 1967 අප්‍රේල් මස 04 දින මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් ඒකඡන්දයෙන් තීරණයක් ගෙන තිබූ බවය. බේරේ වැවට සමාන්තරව පිහිටා ඇති හිස් ඉඩමක නව පාර්ලිමේන්තුව ඉදිකිරීම සඳහා තීරණයක් ගැනීමට මන්ත්‍රීවරුන් නවදෙනෙක්ගෙන් යුත් කමිටුවක් පත්කර තිබූ බව ද ජනපතිවරයා අභිනව පාර්ලිමේන්තුව අමතමින් කියා සිටී. එම ගොඩනැගිල්ල සඳහා අයවැයෙන් මුදල් වෙන් කර තිබුණ ද එහි සංවර්ධන කටයුතුවල නම් ප්‍රගතියක් සිදුව නැත.

පසුව නැවතත් 1970 අගෝස්තු 03වැනි දින සිරිමාවෝ මැතිනිය අගමැතිනිය ලෙස පත්වීමෙන් අනතුරුව නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සියලු පක්ෂ නායකයන් හා එක්ව තීරණයක් ගෙන ඇත. ගාලු මුවදොර පිහිටි භූමි භාගයක් මේ සඳහා තෝරා ගැනුණු අතර ශක්‍යතා වාර්තාවක්ද සකසා තිබුණු මෙම පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සැලැස්ම සකසා තිබුණේ ද වර්තමාන පාර්ලිමේන්තුව නිර්මාණයට හිමිකම් කියන, එඩ්වඩ් රීඩ් සහ බෙග් සමාගමේ ගෘහ නිර්මාණ ශිල්පී ජෙෆ්‍රි බාවා විසිනි. මේ සඳහා විසි දෙලක්ෂයක මුදලක් වෙන් කර තිබුණද, උත්සව කමිටුව විසින් 1973 මැයි මස 17 ප.ව. 1.09 ට මුල්ගල් තබන්නට පැමිණිය හැකිදැයි කථානායකවරයා කළ ඉල්ලීමට අගමැතිනිය ප්‍රතිචාර නොදැක්වූ හෙයින් එම අලුත් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ වැඩ කටයුතු දෙවන වරට ද කල් ගියේය. මෙයින් පෙනී යන්නේ, කිසියම් රටක නූතන අගනුවරක් හෝ නූතන මන්ත්‍රණ සභාවක් ගොඩනැගීම පහසු කටයුත්තක් නොවන බවයි.

නිදර්ශනයකට බ්‍රිතාන්‍යයේ - ලන්ඩන් නුවර 17 වන සියවසේ සිට අඛණ්ඩව විකාශනය වූවේ, නගර අවකාශයට ක්‍රමිකව පාර්ලිමේන්තුව, බකිංහැම් මැදුර, ශාන්ත පෝල් දේවස්ථානය මෙන්ම එහි සැබෑ ස්මාරකය වන ලන්ඩන් කුළුණද සමඟිනි. ඉන්දියානු නව - දිල්ලියේ අතීතාවර්ජනය මීට වෙනස් ය. යටත්විජිත දිල්ලිය ඉන්දියාවේ අගනුවර විය යුතු යැයි තීරණය කිරීම 1911 දී 5 වන ජෝර්ජ් රජු ගත් තීරණයකි. මෙරට ප්‍රථම විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන අගනුවර කොළඹින් නව

ජයවර්ධනපුරයට විතැන්කරණය සම්බන්ධව ගවේෂණශීලිව ලියන තිස්ස අබේසේකර සූරීහු එය තුඩුගල පරම්පරාවෙන් එන පෞරාණික ලිපියක් ජයවර්ධනට හමුවීමෙන් සිදුවූවක් යැයි සාක්ෂි ගෙනහැර පාති (අබේසේකර,2009). කෙසේ වෙතත්, නිශ්ශංක අලගක්කෝනාරගේ ජය බිමෙහි නව පාර්ලිමේන්තු පරිශ්‍රය තැනීම අරබයා කිසිඳු ලාංකික ප්‍රජාවක් විරෝධය පළ කළේ නැති වීම නම් විශේෂත්වයකි. කෝට්ටේ පාර්ලිමේන්තුව නිසැකයෙන්ම පැහැදිලි ධූරාවලියක්ද නොවන, සෙල්මුවා ගොඩනැගිල්ලක් ද නොවන පුරාණ බලකොටුවක ලක්ෂණ දරයි. එය මෙරට ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලකුණක් විය යුතු බෙදීම් විරහිත බව, උඩරට - පහතරට එක්වීමට නියම වූ කෝට්ටේහි ගොඩනැංවීමට ගත් තීරණයද වැදගත් වන්නේ ය. මෙරට ගෘහ නිර්මාණ ඉතිහාසයෙහි ද  මෙමස සතළිස් වසරක් සපුරන වත්මන් පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සැලකෙන්නේ, නිවර්තන නූතනවාදී සහ කාලයට වඩා ඉදිරිගාමී වූ හරිතමය වියමනක් ලෙසිනි.

1978 වසරේ දී දෙවන ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දී, ඊට පසුව එකතු වූ සංශෝධන මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන 225 දක්වා ඉහළ නැංවුණු අතර එහිදී ගාලුමුවදොර පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පිහිටි ඉඩකඩ මඳ වීමත් සමඟ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ප්‍රායෝගික අවශ්‍යතාවය මතු විණි. ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 1979 ජූලි මස 04 වන දින අනුමැතිය හිමි විය. ඉදිකිරීම් කටයුතු 1979 නොවැම්බර් මාසයේදී ආරම්භ වූ අතර මාස 26ක් වැනි කෙටි කාලයක් තුළදී ඉදිකිරීම් කටයුතු නිම කෙරිණි. එවකට ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනගේ මඟපෙන්වීම යටතේ අගමැති ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මෙහෙයවා, වැඩ නිම වී 1982 අප්‍රේල් මාසයේ 29 වන දින පෙ.ව 10.48ට යෙදුණු සුබ මොහොතින් අභිනව පාර්ලිමේන්තුව උත්සවකාරයෙන් විවෘත කරනු ලැබීය. වර්ෂ 1833 දී ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය පිහිටුවීමෙන් අනතුරුව ඉදි වූ තුන්වන ගොඩනැගිල්ල ලෙස මෙය සැලකේ.

නව පාර්ලිමේන්තුව විවෘත කිරීමට මාසයකුත් දින දෙකකට පෙර විශේෂ ප්‍රකාශනයක් මඟින් පාර්ලිමේන්තුව වර්ෂ 1982 අප්‍රේල් මාසයේ 29 වන දින උදෑසන 10.15 කණිසමට රැස්වන ලෙස කැඳවීම් කර තිබූ අතර එහිදී ජනපති ජයවර්ධන මහතා පාර්ලිමේන්තුව අමතමින් කළ දේශනය සුවිශේෂී වේ.





**"මෙම සභා ගර්භය තුළ අප කළ කතා හා අප හැසිරුණ ආකාරය අපේ දීප්තිමත් යුගය පිළිබිඹු කෙරේ යැයි මතු උපදින පරම්පරාවලට කිව හැකි වන පරිදි බහුජන හිත පිණිස, සුව පිණිස ප්‍රජාතන්ත්‍රවාදීව මේ සිද්ධස්ථානය තුළ හැසිරීමට හා ක්‍රියා කිරීමට අපි අධිෂ්ඨාන කර ගනිමු"** යි හෙතෙම සඳහන් කර තිබේ.

එවකට ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වා දී වැඩි කලක් නොගිය නමුත් සභාවේ කටයුතු සජීවීව මුළු දිවයින පුරා විකාශය කෙරිණි. එදින පූර්ව භාග 11.05ට සභාව ඇමතූ අග්‍රාමාත්‍ය ගරු ආර්.ප්‍රේමදාස මහතා ප්‍රකාශ කර සිටියේ, **ජනතාව අඛණ්ඩව එක්සත් කරමින් ද, නිරන්තර අදහස් හුවමාරුවෙන් ද, සීමාරහිත සම්බන්ධතාවයකින් ද ජීවත්වීම මහජන නියෝජිතයෙකුගේ පරම යුතුකම**" බවයි.

විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු ඒ. අමිර්තලිංගම් මහතා සඳහන් කළේ, "**අද දින සමාරම්භක වන කෝට්ටේ යුගයේ ජීව චින්තනය, එනම් සමානාත්මතාවයේ ජීව චින්තනය, සැමට නිදහස පිළිබඳ ජීව චින්තනය යළි පුනර්ජීවනය ලබනු ඇතැයි අපි සැවොම ප්‍රාර්ථනා කරමු**"ය යන්නයි.

මෙරට ජනවාර්ගික නියෝජනය පාර්ලිමේන්තු සභාගර්භය තුළ ආණ්ඩු පාර්ශ්වයේ හා විපක්ෂයේ පාර්ශ්වයේ ප්‍රධාන තනතුරු මඟින් පිළිබිඹු වී තිබීම ද එදින කැපී පෙනෙන කාරණයක් විය. තව දුරටත් එදින පූර්ව භාග 11.33 ට විරුද්ධ පාර්ශ්වයේ නායක ගරු ඒ. අමිර්තලිංගම් මහතා ද, අපර භාග 12.06ට ගරු මෛත්‍රීපාල සේනානායක මහතා ද, අපර භාග 12.20 ගරු සරත් මුත්තෙට්ටුවේගම මහතා ද, අපර භාග 12.32 ට ගරු ආනන්ද තිස්ස ද අල්විස් මහතා ද සභාව ආමන්ත්‍රණය කරමින් මෙකී ඓතිහාසික මොහොත සම්බන්ධයෙන් අදහස් දැක්වූහ.

හැන්සාඩ් වාර්තාවට අනුව, අභිනව පාර්ලිමේන්තුව විවෘත කරන අවස්ථාවේ පාර්ලිමේන්තුවේ කථානායක වශයෙන් ගරු එම්. ඒ. බාකීර් මාකර් මහතා කටයුතු කර ඇති අතර ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සභානායක වශයෙන් කටයුතු හොබවා ඇත. එවකට පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය ගරු එම්. වින්සන්ට් පෙරේරා මහතා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධුරය දැරීය. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක වූයේ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ ගරු එක්ස්. එම්. සෙල්ලතම්බු මහතාය. එවකට පාර්ලිමේන්තුවේ මහ ලේකම් ලෙස කටයුතු කළේ එස්. එන්. සෙනෙවිරත්න මහතාය.

සුපුරුදු පරිදි, පාර්ලිමේන්තු රැස්වීමේ කටයුතු අවසානයේදී අභිනව පාර්ලිමේන්තුවේ වැඩකටයුතු අපර භාග 01.08 ට අවසන්ව ස්ථාවර නියෝග අංක 07 යටතේ 1982 මැයි 04 වන අඟහරුවාදා අපර භාග 3 වන තෙක් කල් ගියේය.

# ප්‍රධාන ද්වාරය






ද්වාරයේ ඇතුළත

පාර්ලිමේන්තු සංකීර්ණයේ ප්‍රධාන දොරටුව වන මෙය පාර්ලිමේන්තුවේ උත්සව අවස්ථාවන්වලදී පමණක් විවෘත වන අතර තඹ උපයෝගී කරගෙන නිර්මිතය. ප්‍රධාන දොරටුව දෙපස පිහිටා ඇති පැති දොර ද්වය පාර්ලිමේන්තුව රැස්වන සාමාන්‍ය දිනවල ජනාධිපතිවරයාට හා අග්‍රාමාත්‍යවරයාට පාර්ලිමේන්තුවට ප්‍රවේශයට සහ පිටවීමට පමණක් විවෘත වේ.

මේ ද්වාරයේ ඇතුළත පිහිටි, ගමන නිර්මාණකරණය සිව්දෙසින් පැමිණෙන අමුත්තන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පිළිගැනීම සිංහ රූපවලින් අරුත් ගන්වන බව පොදු මතයයි. 13 වන සියවසේ සැලැස්මකට අනුව නිර්මාණය වූ ලෝකඩ සිංහ ස්තම්භ සතරක් ද්වාරභ්‍යන්තරයෙහි පිහිටා ඇත.

# සභා ගර්භයේ ප්‍රධාන ද්වාරය



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භයට පිවිසෙන ප්‍රධාන ද්වාරය ලාංකේය කලාකරුවාගේ ප්‍රතිභාව ලොවට විදහාපාන විශිෂ්ට නිමැවුමකි. ඩී. විමල් සුරේන්ද්‍ර නම් ශිල්පියාගේ කැටයමින් අලංකෘත මෙම ද්වාරය දිගින් අඩි 12ක් සහ පළලින් අඩි 12 ක් වන අතර තඹ වලින් නිමවා රිදී තහඩුවකින් ආවරණය කර ඇත.

මෙම රිදී තහඩුව මත පුරාණ සෙල්ලිපි රටාව අනුව යමින් ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් කැටයම් කොට ඇති අයුරු මනෝරමණීය වේ. මෙම ද්වාරයෙහි පිටත මායිම්, පුරාණ හෙළ කලාවට අනන්‍ය වූ දර්ශනීය නෙළුම් මල් රටා සහ නානාවිද සැරසිලි



මෝස්තර කැටයමින් සමලංකෘතය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති පුරාණ ශ්‍රී ලාංකික උඩු වියනක ඇති මල් මෝස්තරයක් ද මෙම ද්වාරයේ පිටුපසෙහි දක්නට ලැබේ. ද්වාරය ත්‍රිමාණ ස්වරූපයක් සහිතව නිර්මාණය කර ඇති අයුරු විස්මය දනවනසුලුය.

අතීත ශ්‍රී විභූතිය සිහිපත් කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ප්‍රෞඪත්වයක් එක්කරන මේ ද්වාරය හෙළ කලාකරුවාගේ නෛපුණ්‍යය විශද කරන අනභිභවනීය නිමැවුමකි.

14 DINAMINA THURSDAY, APRIL 29, 1982. දිනමිණ වර්ෂ 1982 ක්‍රි.ව. අප්‍රේල් මස 29 වැනි බ්‍රහස්පතින්දා

# නව අගනුවර බබළවන මිණී කිරුළ



ඓතිහාසික දියවන්නා ඔයේ නිල්වන් ජලයෙන් වට කොට ගත් නව පාර්ලිමේන්තුව ගුවනට දිස් වන්නේ මෙසේය.




සභා ගැබට පිවිසෙන දොරටුව



සභා ගැබේ දර්ශනයක්



තැන තැන බිතු සිතුවම්ය



සභා ගැබ එළිය කරන විසිතුරු පහන




සුවිසාල භාණ්ඩාගාරවලින් ඉදිරිපස විසිතුරු වෙයි



කෝරළ කොඩි වලින් සභා ගැබට අලුත් එළියක්



මහා ජනතාවට පහසුකම්



ඉහළ මාලයේත් අරලිය ගස්




විශේෂ සභා ශාලාවක්

ඡායාරූප— ● ප්‍රේමදාස විජේසේකර ● රෝලන්ඩ් පෙරේරා ● ඩග්ලස් ඩයස් ● නිහාල් ඇතුළත්මුදලි
සැකසුම— ● තිස්ස එදිරිසිංහ

**පුවත් හසුනට සකස් කළේ - සියාද් අහමඩ්**

# පාර්ලිමේන්තුවට සපැමිණි විශේෂ අමුත්තන්



























# පාර්ලිමේන්තු සභා ගර්භයේ සීමාව



**බ්‍රිතාන්‍ය මවු පාර්ලිමේන්තු සම්ප්‍රදායේ ආදර්ශයට අනුකූලව පිහිටුවා ඇති ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සම්පාදනය කිරීමේ උත්තරීතර ආයතනය වෙයි.**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භය යනු ඉහත සඳහන් ව්‍යවස්ථා සම්පාදන කාර්යය සිදුකරනු ලබන ස්ථානයයි. ඒ නිසාම එය පාර්ලිමේන්තු ගොඩනැගිල්ල තුළ පිහිටා ඇති වඩාත් වැදගත් ස්ථානය වෙයි.

පාර්ලිමේන්තු සභා ගර්භයේ ප්‍රධාන ද්වාරයෙන් සභා ගර්භයට පිවිසීමට ඇති පියගැට පෙළට ඔබ්බෙන් සභා ගර්භයේ මැද කොටස මත අතුරා ඇති ලෝහිත පැහැති විල්ලුද පලස මත, දිගු ඍජුකෝණාස්‍රාකාර නිකල් ලෝහයෙන් නිර්මිත තහඩුවක් වෙයි. මෙය පාර්ලිමේන්තු සභා ගර්භයේ සීමාව සලකුණු කරයි.


පාර්ලිමේන්තු සභා ගර්භයේ සීමාව දක්වන ඍජු සීමා දර්ශකයෙන් නිර්නය කරනුයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, නීති සම්පාදනයේ උත්තරීතරභාවය සහ පාරදෘශ්‍යභාවය සුරක්ෂිත ස්ථානයේ ගෞරවනීයත්වයයි.

එමෙන්ම සංකීර්ණ මෝස්තර කැටයම් කර තිබේ. එය මඟින් නිර්නිතභාවය, සදාකාලිකත්වය සහ සෞභාග්‍ය, ඒකීයත්වය මෙන්ම පාර්ලිමේන්තු සභා ගර්භයේ ගෞරවනීය භාවයද සංකේතාත්මක කෙරේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ සභා ගර්භ නිලධාරියකු හෝ නොවන කිසිම පුද්ගලයෙකුට මෙම සීමාවෙන් ඔබ්බට ගමන් කිරීමට අවසර නොලැබේ.

මහ මැතිවරණයකින් පසුව පාර්ලිමේන්තුව රැස්වන ප්‍රථම දිනයේදී සියලුම මන්ත්‍රීවරුන් සභා ගර්භයේ සීමාව තුළ අසුන් ගෙන සිටින අවස්ථාවේදී හැර, වෙනත් අවස්ථාවකදී දිවුරුම්/ ප්‍රතිඥා දීමට නියමිත මන්ත්‍රීවරයකු එසේ දිවුරුම්/ ප්‍රතිඥා දීමට පෙර සභා ගර්භයේ සීමාව මත රැඳී සිටිය යුතුවේ.

එයට අමතරව කිසියම් කරුණක් උදෙසා පාර්ලිමේන්තුව හමුවට කැඳවනු ලැබූ පුද්ගලයකු හෝ කණ්ඩායමක් අදාල කාර්යය වෙනුවෙන් සභා ගර්භය තුළට කැඳවනු ලබන තුරු සභා ගර්භ සීමාව මත රැඳී සිටිය යුතු වේ.



## පැරණි පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී අසුන

තේක්ක දැවයෙන් තනා ඇති මෙම අසුන, පැරණි පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ දී වේත්‍රධාරීවරුන් විසින් භාවිත කරන ලදී. තද නිල් පැහැයෙන් යුතු සම් ආවරණයෙන් ආසනයේ කුලිච්චම (කුෂන්) සැකසී ඇති අතර අසුනේ උස අඩි පහකි.




# අපේ පාර්ලිමේන්තුව පසු කළ දේශපාලන ප්‍රතිසංස්කරණ සැකෙවින්

**එස්. ජේයප්‍රකාශ්**

*මහජන සේවා සම්බන්ධීකරණ නිලධාරී - සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**අන් බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද ව්‍යවස්ථාදායකයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ව්‍යවස්ථාදායකය නැතහොත් පාර්ලිමේන්තුව රට කරවන ස්ථානය ලෙස හඳුන්වනු ලැබේ.**




වර්තමානයේ දී ව්‍යවස්ථාදායකය රැස් වන්නේ ශ්‍රී ජයවර්ධනපුර පිහිටි පාර්ලිමේන්තු සංකීර්ණයේදීය. දියවන්නා ඔයෙන් වටවූ පාර්ලිමේන්තු සංකීර්ණය මේ වසරේ අප්‍රේල් මස 29 වැනි සිකුරාදාවෙහි සිය හතළිස් වැනි සංවත්සරය සමරයි. මෙරට ආරම්භක පාර්ලිමේන්තුවේ සිට වර්තමාන පාර්ලිමේන්තු සංකීර්ණය දක්වා පැමිණි ගමනෙහි පසුකළ දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ සංක්ෂිප්ත විමසා බැලීමක් මෙම ලිපියට අන්තර්ගත වෙයි.

මෙරට ක්‍රි.ව 1505 දී පෘතුගීසි ආක්‍රමණයට නතු වූ අතර, පසුව ලන්දේසීන් විසින් ද, 1796 දී ඉංග්‍රීසි ආක්‍රමණයට ද ලක්ව, 1815 දී ඉංග්‍රීසීන් විසින් උඩරට ගිවිසුම අත්සන් කිරීමත් සමඟ ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ගේ සම්පූර්ණ යටත්විජිතයක් බවට පත්විණ. එසේ මෙරට පාලනය සියතට ගත් ඉංග්‍රීසින් විසින් 1833 දී මෙරට පාලනය සඳහා දේශපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් කෝල්බෲක් හා කැමරන් කොමිසම පිහිටුවා,


උඩරට ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාව

ව්‍යවස්ථාදායකය හා විධායක සභා ක්‍රමය මහජනතාව වෙත හඳුන්වා දෙන ලදී.



ඒ අනුව, එසේ පිහිට වූ එම සභා ප්‍රථමයෙන්ම රැස්වූයේ කොළඹ කොටුවේ පිහිටි වර්තමාන විදේශ කටයුතු අමාත්‍යංශය පවත්වාගෙන යන්නා වූ ගොඩනැගිල්ලේ දීය. එය ව්‍යවස්ථාදායකයක් සඳහා භාවිත කළ මෙරට පළමු ගොඩනැගිල්ල ලෙස හැඳින්විය හැකිය.

අනතුරුව ඇති කළ මැකලම් හා මැනින් ප්‍රතිසංස්කරණවලින් ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් වැඩි වූ අතර 1931 දී ඇති කළ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මඟින් සභිකයින් ගණන 61 ක් දක්වා වැඩිවිණි. ඒ හේතුවෙන් ව්‍යවස්ථාදායක සභාව මෙතෙක් රැස්වූ ගොඩනැගිල්ලේ තිබූ ඉඩකඩ මඳ වීම මත නව ගොඩනැගිල්ලක අවශ්‍යතාවය මතුවිය. දෙවැනි පාර්ලිමේන්තුව ලෙස අප අද ව්‍යවහාර කරන, ගාලුමුවදොර පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ඉදි වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

යුරෝපීය ගෘහ නිර්මාණයට අනුව ඉදි වූ, ගම්භීර, අභිමානවත් මෙන්ම අලංකෘත ගොඩනැගිල්ලක්

වූ වර්තමාන ජනාධිපති ලේකම් කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යන එම ගොඩනැගිල්ලේ 1930 සිට 1982 දක්වා ව්‍යවස්ථාදායක සභාවේ රැස්වීම් කටයුතු පවත්වාගෙන යන ලදි.
මෙම ගොඩනැගිල්ල අපේ රටේ ව්‍යවස්ථාදායක සභාව සඳහා භාවිත කළ දෙවැනි ගොඩනැගිල්ල ලෙස හැඳින්විය හැකිය.

පසුව, 1946 දී හඳුන්වාදුන් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් තවත් දේශපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් මෙතෙක් නියෝජිතයන් 61 ක් සිටි ව්‍යවස්ථාදායක සභාව වෙනුවට සභිකයින් 101 කින් සමන්විත උත්තරීතර හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හඳුන්වා දෙන ලදී.

1948 පෙබරවාරි 04 වන දින අප රටට ඩොමීනියන් තත්ත්වයේ නිදහසක් හිමිවූ අතර 1972 මැයි මස 22වැනි දින අප රට ශ්‍රී ලංකා ජනරජයක් ලෙස හැඳින්වෙන්නේ පළමු ජනරජ ව්‍යවස්ථාව සම්පාදනයත් සමඟය. එමඟින්, සභිකයින් 168කුගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාව බිහිවිය.

1978 දී ඉදිරිපත් කළ දෙවන ජනරජ ව්‍යවස්ථාව සමඟ පාර්ලිමේන්තු නියෝජිතයන් ගණන 225ක් වූ බැවින් මෙතෙක් ජාතික රාජ්‍ය සභාව රැස් වූ ගාලුමුවදොර දෙවැනි පාර්ලිමේන්තුවේ ගොඩනැගිල්ලේ ඉඩකඩ මදි වීමත් සමඟ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක අවශ්‍යතාවය මතුවිය.

ඒ අනුව, 1979 දී නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් සඳහා වූ යෝජනාව ඉදිරිපත් කළ අතර ඓතිහාසික ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ දියවන්නා ඔයෙන් වට වූ අක්කර 16ක පමණ භූමි ප්‍රමාණයක එම ගොඩනැගිල්ල ඉදිකිරීමට අනුමැතිය හිමිවිණි.

ඒ කටයුත්ත, කීර්තිමත් ගෘහ නිර්මාණ ශිල්පියකු වූ ජෙෆ්රි බාවා හට පැවරුණු අතර එතුමා දේශීය සම්ප්‍රදායන් වලට මුල්තැන දෙමින් සිය සැලසුම නිර්මාණය කළේය. විශේෂයෙන්ම මෙහි ගෘහ නිර්මාණ කටයුතු සඳහා දේශීය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ දායකත්වය ලබාගැනීම ද විශේෂත්වයකි. එම සැලැස්මට අනුව ජපානයේ මිට්සුයි කොන්සෝඩියම් සමාගම විසින් මෙරට තෙවැනි පාර්ලිමේන්තුව සඳහා නිමැවුම ගොඩනඟන ලදී.

ඒ අනුව, 1982 අප්‍රේල් 29 වන දින එවකට ජනාධිපති වූ ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා හා අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙරට තෙවැනි පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. එළඹෙන, 2022 අප්‍රේල් 29 දිනට සිය හතළිස් වන වන සංවත්සරය සමරන දියවන්නා පාර්ලිමේන්තු සංකීර්ණය මෙරට ව්‍යවස්ථාදායක කටයුතු සඳහා මහඟු මෙහෙවරක් ඉටු කරයි.

## ඝණ්ටාර යුගලය...




මෙම ගොඩනැගිල්ල නිර්මාණය කිරීමේදී ප්‍රධාන ඉදිකිරීම් සමාගම ලෙස කටයුතු කළ ජපානයේ මිට්සුයි සමාගමෙන් තිළිණ කළ ඝණ්ටාර යුගලය පාර්ලිමේන්තුව ඉදිරිපස විශේෂ උත්සව ශාලාව ආසන්නයේ පිහිටුවා ඇත. අතීත රජ දවස මහජනයාගේ දුක් ගැනවිලි රාජ සභාවට දැනුම් දීම උදෙසා රජ මාළිගාව ඉදිරිපස ඝණ්ටාරයක් සවිකර තිබූ බව ජනප්‍රවාද තුළ සුලබව අසන්නට ලැබේ. ඒ හා සමපාත වන මෙම ඝණ්ටාර යුගලය තුළින්ද පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවද මහජනයාට සිය දුක්ගැනවිලි පවසනු පිණිස එක් රැස්ව කටයුතු කිරීමට යෝග්‍ය ස්ථානයක් බවයි.

තවද එය පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සමබරතාවය පෙන්නුම් කිරීමට එනම්, කිසියම් අවස්ථාවක ගොඩනැගිල්ලේ එක් කොටසක් හෝ ගිලාබැසීමට ලක්වුවහොත් එය මෙම ඝණ්ටාර යුගලයේ යම් ඇලවීමක් මඟින් පෙන්නුම් කරන බවටද බොහෝදෙනා අතර විශ්වාසයක් තිබේ.

# නව පාර්ලිමේන්තු මැඳුරේ ජනතාවට වැඩි පහසුකම්

පාර්ලිමේන්තුවේ සහකාර ලේකම්
එච්. ඒ. ඩී. වනසිංහ
විසිනි

# බලතල සංකේතය



## ජයවර්ධන යුගය

දුමිඳු රාමසිංහ

## විමුක්තියේ සෙවණ

කටුවාණේ පියදස පෙරේරා

ප්‍රේමචන්ද්‍ර අල්විස්



එස්. පී. චාර්ලස්
විසිනි

# නව මැති සබ මැදුර මැවූ විස්කම් අත්:

## ගෘහ නිර්මාණ ශිල්පියා

## සිතුවම් හා කැටයම්

පුවත් හසුනට සකස් කළේ - සියාද් අහමඩ්

ලබේ මිණිකැටයට විශ්වාසය, සාධාරණය ලාභදායී මිල ගුරුගේ මැණික් කහවත්ත

# දිනමිණ
THE DINAMINA

ශ්‍රී ලංකාවේ අතාම විශාල ලෙස අලෙවි වන දිනපතා පත්‍රය

THE DAILY WITH THE LARGEST CIRCULATION IN SRI LANKA.

ගුරුගේ මැණික් කහවත්ත

FRIDAY, APRIL 30, 1982.

# මල් වැසි ආසිරි මැද්දේ නව මැඳුරට පිවිසේ

## ශ්‍රී ජයවර්ධන පුරයට සිවු දිගින් රොක්වෙති

ඓතිහාසික ශ්‍රී ජයවර්ධන පුරයේ ඉපැරැණි ශ්‍රී විභූතිය යළි ඔප නැංවුණු සුබ මොහොතට ආසිරි මල් වැසි වසිද්දී එම පුරවරයේ මිණි කිරුළ වන් නව පාර්ලිමේන්තු සංකීර්ණය ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන් අතින් රටේ විවෘත කෙරිණි.



පක්ෂ සියල්ල එති

ශිලාතිප බේදය මෙතැනදිත්

## අපේ ඉදිරි ගමන ආසියාවටත් ලොවටත් පහන් ටැඹක් වේවා
-අගමැතිතුමා

මාතිපාදි මන්ත්‍රීගේ රිය පොඩි කරති

## පාර්ලිමේන්තු ප්‍රජා තන්ත්‍රයේ නව යුගයක් අද අරඹමු
-ජනාධිපති තුමා





**පුවත් හසුනට සකස් කළේ - සියාද් අහමඩ්**

# මහජනයා අතරට එන ඔබේ පාර්ලිමේන්තුව

**දුමින්ද වික්‍රමසිංහ**

*මහජන සේවා නිලධාරී - සන්නිවේදන දෙපාර්තමේන්තුව*



**ශ්‍රී ජයවර්ධනපුර අගනගරයේ පිහිටි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අප්‍රේල් මස 29 වන දිනට වසර 40 සම්පූර්ණ කරන්නේ ආසියාවේ පැරණිතම ප්‍රජාන්ත්‍රවාදය හිමි රටක ගෞරවනීය අභිමානයද සමඟිනි. ප්‍රජාව විසින් ප්‍රජාව උදෙසා සිදු කරන වඩා ඵලදායි පාලන ක්‍රමවේදයක හැරවුම් ලක්ෂ්‍යය 1931 දී මෙරටට සර්වජන ඡන්ද බලය ලබා දීම මඟින් වඩාත් තහවුරු විණි. සියවස් ගණනාවක අවිච්ඡින්න ඉතිහාසයකින් අනතුරුව, යටත්විජිත පාලනයක සිට නිදහස්, ස්වාධීන හා ස්වෛරී රාජ්‍යයක් දක්වා ක්‍රමිකව විකාශය වූ පාර්ලිමේන්තු ක්‍රමය මහජන පරමාධිපත්‍යය මත ම පදනම් විණි.**

ශ්‍රී ලංකාවේ පාලනමය ක්‍රියාවලිය තුළ පාර්ලිමේන්තුවට හිමි වන ස්ථානය සුවිශේෂී වේ. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කරන ව්‍යවස්ථාවකින් හෙබි මෙරට පාලනය සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීමේ බලය, පොදු මහජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයන් 225 කින් සමන්විත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත පවරා තිබේ. නීති සම්පාදනය කිරීම ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුව මඟින් සිදු කෙරෙන මූලික කාර්යභාරයන්ගෙන් එකක් වන අතර, රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව බලතල හිමිව ඇත්තේද පාර්ලිමේන්තුවටයි.

ලොව පාර්ලිමේන්තු ක්‍රමය ක්‍රියාත්මක වන සෑම රටකම මෙන් අපේ පාර්ලිමේන්තුවේ ද සිදු වන මුඛ්‍ය කාරණා අතරින් පොදු මහජනතාවට වඩාත් සමීපව ඇත්තේ පාර්ලිමේන්තුවේ සභාගර්භය අභ්‍යන්තරයෙහි සිදුවන ක්‍රියාවලියයි. එය ඉතාමත් සංකීර්ණ ව්‍යවස්ථාදායක සම්ප්‍රදායයන්, පරිචයන් සහ නීතිරීති සමඟ බැඳී පවතී. බොහෝ විට විවිධ පුද්ගලයින්ගේ මාධ්‍ය භාවිතයේ විවිධත්වය, සාර්වභාවය හා නිවැරදිභාවය මත පාර්ලිමේන්තුව පිළිබඳව ගොඩනඟන ප්‍රතිරූපය සහ එය මහජනතාව වෙත සමීප වන ආකාරය සහ ඔවුන් එය උකහා ගන්නා ආකාරය පිළිබඳව විවිධ විවේචන පවතී.

පාර්ලිමේන්තු සභාගර්භය තුළ කටයුතු පවත්වාගෙන යාම සඳහා අනුමත කර, සම්මත කළ, ස්ථාවර නියෝග වලට අනුව පාර්ලිමේන්තුව මාසයකට දින 08ක් රැස්වීම සිදු කරනු ලබයි. එසේ රැස්වීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය, පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරක, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය, පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු අනෙකුත් ලිපි ලේඛනාදිය සැකසීම, පාර්ලිමේන්තුවේ වැඩකටයුතු පිළිබඳ අනුපිළිවෙළ සැකසීම, පාර්ලිමේන්තුවේ කාර්ය සටහන් ආදී ලේඛන රැසක් පදනම් කර ගැනේ.

එමෙන්ම, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම සමගාමී භාෂා පරිවර්තනය, සභා ගර්භය තුළ පැවැත්වෙන සෑම විවාදයකම මන්ත්‍රීවරයන් ප්‍රකාශ කරන සෑම වචනයක්ම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කර හැන්සාඩ් වාර්තා සැකසීම, තාක්ෂණික සේවා සැපයීම්, තොරතුරු පද්ධති සහ සන්නිවේදන ජාල පවත්වාගෙන යාම, දත්ත, සංඛ්‍යා ලේඛන ඇසුරින් පර්යේෂණ වාර්තා සකස් කිරීම, පාර්ලිමේන්තු රැස්වීම් සජීව විකාශය පවත්වාගෙන යාම, මූල්‍ය කළමනාකරණ කටයුතු, ආරක්ෂක සේවා සැපයීම් ආදි සංකීර්ණ කටයුතු රැසක් සිදු වේ.

එමෙන්ම, කුඩා පාර්ලිමේන්තු ලෙසින් නම් දරන පාර්ලිමේන්තු කාරක සභා ද ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය හා සබැඳි සුවිශේෂි මෙහෙයන් රැසක් ඉටු කරනු ලැබේ. එකී කාරක සභා ක්‍රියකාරිත්වය හා මහජන සහභාගීත්වය පිළිබඳවද පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක විශේෂ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක

සභා, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා, විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා ආදී කාරක සභා රැසක් මඟින් පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වීම ප්‍රජාතන්ත්‍රවාදයේ සහ පාර්ලිමේන්තු නියෝජන ක්‍රමයේ තවත් සක්‍රීය අවස්ථාවක් බව සඳහන් කළ යුතුමය.

සාමාන්‍යයෙන්, මූලික වශයෙන් පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමේදී පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සිදුවන ව්‍යවස්ථාදායකමය කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු වුවද, උක්ත කාරණා පිළිබඳව සාමාන්‍ය, පොදු මහජනතාව සතු අවබෝධය පවතිනුයේ විවාදාත්මක තලයකය. මූලික වශයෙන්ම, දෛනිකව මාධ්‍ය වාර්තා කරන තොරතුරු වලට අමතරව පාර්ලිමේන්තුව තුළ සිදුවන මෙම සංකීර්ණ ක්‍රියාවලිය පොදු මහජනයා වෙත ගෙන යාම සඳහා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින් විවිධ සන්නිවේදන භාවිතාවන් යොදා ගනී. පාර්ලිමේන්තු පාර්ලිමේන්තු රැස්වීම් සජීව විකාශය, ෆේස්බුක්, යූ ටියුබ්, ට්විටර්, ඉන්ස්ටග්‍රෑම් ආදි ප්‍රමුඛතම සමාජජාල මාධ්‍ය ඉන් මූලික වේ. ඉන් නොනැවතී, සමාජයේ ජීවත්වන සෑම ස්තරයකටම, සෑම සමාජ කණ්ඩායමක් වෙතම පාර්ලිමේන්තුවේ න්‍යායික හා ප්‍රායෝගික වටිනාකම් ගෙන යාමට පුළුල් සමාජ අවකාශයක් නිර්මාණය පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ.

පාසල් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, සමාජ සංවිධාන, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, බහුවිධ ප්‍රජා කණ්ඩායම් ඇතුළු සමස්ත මහජනතාව වෙත ප්‍රජාතන්ත්‍රවාදය හා එහි වගකීම පිළිබඳව පුළුල් අවබෝධයක් සමීපස්ථ කරවමින්, නීතියේ ආධිපත්‍යය, සර්වජන ඡන්ද බලය වගකීමෙන් යුතුව භාවිතය මෙන්ම අනාගත පාලකයන් මෙන්ම සක්‍රීය, විශ්වීය පුරවැසියන් ලෙස සිය දායකත්වය ලෝකයට සැපයීමෙහි අභිප්‍රේරණයක් ඇති කිරීම මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් වන පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව විශ්වාසය මහජනයා තුළ තහවුරු කිරීමද මහජන සේවා සැපයීම මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිතය.

එමෙන්ම, පාර්ලිමේන්තුව හා සබැඳි නොයෙක් අවස්ථාවන් වලදී විවෘත මහජන සහභාගිත්වයක් සඳහා පහසුකම් සැපයීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ, මහජන සේවා අංශය තුළින් සිදු කරනු ලබන අතර,











ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ එහි කටයුතු පිළිබඳ නැරඹුම් චාරිකා මෙන්ම ශ්‍රී ලංකාවේ වසර සිය ගණනක පාර්ලිමේන්තු ඉතිහාසය ද දේශිය මෙන්ම විදේශිය නරඹන්නන් වෙත ඉදිරිපත් කිරීමද මෙහිලා සුවිශේෂී වේ. සෑම වසරකම පාර්ලිමේන්තුව වෙත පැමිණෙන දහස් සංඛ්‍යාත අමුත්තන් වෙත පාර්ලිමේන්තුව තුළදී විවාදයන් නැරඹීමට පැමිණීමට, ඔවුන්ගේ මන්ත්‍රීවරයා හමුවීමට හෝ උත්සවයකට සහභාගී වීමට අවස්ථාව ලබා දෙන, අත්‍යවශ්‍ය පිළිගැනීමේ සහ ප්‍රවේශ සේවා සපයා දීමද පාර්ලිමේන්තුවේ මහජන සේවා ක්‍රියාවලිය තුළ පහසුවෙන් හඳුනාගත හැකිය.

වසර ද්වයකට අධික කාලයක් පැවති කොවිඩ් අභියෝගකාරී තත්ත්වය තුළ මෙන්ම ඉන් පසු මෙරට නව සාමාන්‍යකරණ තත්ත්වය තුළ ද පාර්ලිමේන්තුව මහජනයා වෙත සමීප කරවීම අඛණ්ඩව සිදු විණි. ඔන්ලයින් තාක්ෂණික ක්‍රමවේදයෙන් නොනැවති සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුගතව මහජනතාව අතරටම පැමිණ පාර්ලිමේන්තු ක්‍රියාවලිය හා සබැඳි කාරණා පිළිබඳ විවිධාකාරයේ වැඩසටහන් සංවිධානය කිරීම මෙහිදී සඳහන් කළ යුතුය. එම වැඩසටහන් මඟින් ප්‍රජාතන්ත්‍රවාදයේ පරිණාමය, ජනතා පරමාධිපත්‍යය, පාර්ලිමේන්තුවේ කාර්යභාරය, පාර්ලිමේන්තු සම්ප්‍රදාය, පාර්ලිමේන්තු ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, කාරක සභා සහ එහි ක්‍රියාකාරීත්වය, ප්‍රජාතන්ත්‍රවාදය හා මාධ්‍ය වාර්තාකරණය, පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ කාර්යභාරය, පාර්ලිමේන්තුව හා අනාගත පුරවැසියාගේ දායකත්වය ආදි බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳව ආවරණය කිරීම සිදු කෙරේ.

අර්ථාන්විත දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, වීඩියෝ දර්ශන මෙන්ම ඩිජිටල් අවකාශයකින් පාර්ලිමේන්තුවට පිවිසීමට මහජනතාව තුළ උත්තේජනයක් ඇති කිරීම මහජන සේවා වැඩසටහන් මඟින් සිදු කෙරෙන අතර, ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක් වෙත පැමිණ මෙම වැඩසටහන් පැවැත්වීමද විශේෂත්වයකි. පාසල් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, රාජ්‍ය නිලධාරීන් මෙන් නොයෙක් ප්‍රදේශවල ග්‍රාම සංවර්ධන සමිති - සංවිධාන ආදිය මඟින්ද මෙවැනි වැඩසටහන් පිළිබඳව ඉල්ලීම් දෛනිකව ලැබෙන ඉල්ලීම් ප්‍රමාණයද වැඩි වෙමින් පවතී.

නගර සභා, ප්‍රාදේශිය සභා, පළාත් සභා ආදි මහජන නියෝජිතයින්ගෙන් සමන්විත පළාත් පාලන ආයතන වෙතද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සිය වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, මෙරට පාලන ව්‍යුහය තුළ ප්‍රාදේශිය දේශපාලනයේ ඇති වැදගත්කම ද මෙහිලා විශේෂයෙන් අවධාරණය කරන අතර, අනාගතයේදී ජාතික දේශපාලනයට පිවිසීමට වක්‍රාකාරයෙන් උත්තේජනයක් ඇති වීමද වැඩසටහනට සහභාගි වූවන්ගෙන් ලැබෙන අදහස් මඟින් තහවුරු වන්නකි. එමෙන්ම, පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ විවෘත සංවාදය මඟින් ඔවුනට ඇති ප්‍රායෝගික ගැටලු විසඳාගැනීමට පුළුල් අවකාශයක් නිර්මාණය කිරීමද සෑම වැඩසටහනකදීම සිදු වේ.

මහජන සේවා වැඩසටහන් සඳහාම නිර්මාණය කරන ලද සෙංකෝලයේ ආකෘතිය, කථානායකවරයාගේ ආසනය, ඡන්දය ප්‍රකාශ කිරීමට භාවිත කරන ඡන්ද පෙට්ටි, කථානායකවරයාගේ නිල ලෝගුවේ ආකෘතිය, ඩිජිටල් පුවරු ආදි ප්‍රදර්ශන භාණ්ඩ පාර්ලිමේන්තුව සතු වන අතර, එමඟින් මහජන සේවා වැඩසටහන් ළඟන්නාසුලු ආකාරයෙන් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබීමද විශේෂත්වයකි. මෙම වැඩසටහන්වලට සමගාමීව ශ්‍රී ලංකාවේ පුස්තකාල වෙත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ සමූහයක් තිළිණ කිරීමද සිදු කෙරන අතර, එමඟින්, තවත් බොහෝ පිරිසකට මෙම දැනුම පරිශීලනයට හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ දසත විසිරී සිටින සෑම පුද්ගලයකුටම පාර්ලිමේන්තුව විවෘත වගත්, ශ්‍රී ජයවර්ධනපුර අගනගරයෙන් පාර්ලිමේන්තුවේ දැනුම රැගෙන ඔබ අසලටම පැමිණීමට අප සූදානම් බවත් අවසන සිහිපත් කරමි. ඒ සඳහා 0112777100 මඟින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව ඇමතීමට ඔබට හැකියාව තිබේ.

# පාර්ලිමේන්තු කාරක සභා

පාර්ලිමේන්තුව තුළ කාරක සභා රැසක් ක්‍රියාත්මක අතර, පනත් සම්මත කිරීමේදී මුඛ්‍ය කාර්යභාරයක් කාරක සභා මගින් සිදු කරයි. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ප්‍රකාරව මෙම කාරක සභා පිහිටුවා තිබේ. ව්‍යවස්ථාදායකයක් සතුව ඇති අධික වැඩ ප්‍රමාණය හා ඒ සඳහා යොදාගත හැකි කාලය සීමාසහිත වීම නිසා පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සෑම කාරණයක්ම දීර්ඝ ලෙස සාකච්ඡාවට භාජනය කිරීම අපහසු කාරණයකි.









මෙම වැඩකටයුතු ඉක්මනින් හා සාධාරණ සැලකිල්ලකින් යුතුව සිදුකිරීමට නම් එහි යම් යම් වගකීම් සමස්ත සභාවේම විශ්වාසය දිනාගත් යම් කිසි කණ්ඩායමකට පැවරීමට සිදුවේ. මෙම කාර්යය සපුරා ගැනීම සඳහා යොදාගෙන ඇති වඩාත් ප්‍රායෝගික ක්‍රමය වන්නේ කාරක සභා ක්‍රමයයි.

එය සමස්ත ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් සුළු සංඛ්‍යාවකින් යුක්ත වූවකි. කාරක සභා පත්කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 වන ව්‍යවස්ථාවෙන් හිමිව තිබේ. එමඟින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පාර්ලිමේන්තුවේ රැස්වීම් කටයුතු විධිමත් කිරීම සඳහාත් පාර්ලිමේන්තු රැස්වීම් වලදී විනය ආරක්ෂා කර ගැනීම සඳහාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධිවිධාන සැලසිය යුතු හෝ බලාත්මක කිරීම අවශ්‍ය වන ඕනෑම කාරණයක් සඳහාත් ස්ථාවර නියෝග සෑදීමේ බලය පාර්ලිමේන්තුවට ලැබී තිබේ.

පාර්ලිමේන්තුව තුළ කාරක සභා රැසක් පවතින අතර, පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව, විශේෂ කාරක සභා, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, තේරීම් කාරක සභාව සහ විශේෂ කාර්යයන් සඳහා කාරක සභා ඊට ඇතුළත්ය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වැනි කාරක සභා රැසක් විශේෂ කාර්යයන් සඳහා කාරක සභා යටතට ගැනේ. රජයේ සැලසුම් හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අධ්‍යයනය කරන්නේ ද මෙම කාරක සභා මඟිනි.









| | |
|---|---|
| NEW COLOUR BULBS FOR WESAK SET 1.35 | 24 Pages |

Automatic Bulbs 5/-
35 Bulb Set 75/-
Jewel Cross Bulb 25/-
Trade Discount — VPP also
Tel. 36106

# Daily News

The English Daily with the largest circulation in Sri Lanka

Late City

FOR WESAK
A must for every Buddhist home & Temple
NEON BULB
with figure of
LORD BUDDHA
55/-
KUMAR ANANDA & ORG.
Second Floor
32 - 2/6, Prince Street,
Colombo 11
Ph: 36106

VOL. 65 (D) NO. 102 Established 3-1-1918. FRIDAY, APRIL 30, 1982. PRICE Rs. 1/75 Registered as a Newspaper in Sri Lanka

## The Kotte period revived...

with power to the people



## Echoes from the past and a pledge to the future

Our country has a very ancient history of government with which the people were associated. Anuradhapura had a mayor (Nagaraguthika) 2000 years ago; Polonnaruwa in the 11th century A.D. had a cabinet of ministers and the buildings in which they deliberated are still to be seen. Village assemblies (Gam Sabhas) have existed from the earliest days.

### The President's address

## A temple of democracy

State Minister's address

### Just in time

### Duet in the House

by Neville de Silva

Thought for the day



President J. R. Jayewardene arrives.

## Beacon light to Asia...and the world

### Prime Minister's address

### Sirima group walks out as Maitri speaks



































# පාර්ලිමේන්තුව සැකෙවින්...

## අප්‍රේල් - 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

### අප්‍රේල් 05

- පාර්ලිමේන්තුවේ සභානායක සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක යන ධුරයන් සඳහා 2022.04.04 දින සිට පිළිවෙළින් ගරු දිනේෂ් ගුණවර්ධන සහ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහත්වරුන් පත්කරන ලද බව පාර්ලිමේන්තුවේදී ගරු කථානායකතුමා විසින් නිවේදනය කිරීම.

- ශ්‍රී ලංකා මහබැංකුවේ නිලධාරීන්ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සම්බන්ධව පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් විශේෂ වැඩසටහනක් සංවිධානය කිරීම.

### අප්‍රේල් 06

දකුණු කොරියානු රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධීකරණ අමාත්‍ය යුන් චියෝල් මහතා සහ ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති ජියෝන් වූජින් මහතා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සමඟ පැවති විශේෂ හමුව.

### අප්‍රේල් 07

- "අධිභාර බද්ද" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කිරීම.

- "අධිකරණයට අපහාස කිරීමේ" පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත දෙවැනි වර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම.

- ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ  සභා ගර්භයට පිවිසීම.

- පාර්ලිමේන්තුවේ සංනිවේදන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද " පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට" යන වැඩසටහන මාතලේ උකුවෙල ප්‍රාදේශිය සභා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීම.

### අප්‍රේල් 08

- "අධිභාර බද්ද" පනත් කෙටුම්පතට කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.

- "කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන)" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී පළමුවැනි වර කියවීම.

**අප්‍රේල් 18**

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ආරාධනයෙන් පක්ෂ නායකයන් සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තුවේදී රැස් වී පවතින අර්බුදකාරී තත්ත්වයට දීර්ඝකාලීන පියවරක් වශයෙන් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමටත්, කෙටි කාලීනව දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සාධනීය විධිවිධාන බලාත්මක කරමින් විසිඑක් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වාදීමට සාකච්ඡා කිරීම.

**අප්‍රේල් 20**

“කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන)” පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.

**අප්‍රේල් 22**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී නව ක්‍රමවේදයක් අනුගමනය කරන බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නිවේදනය කිරීම.

**අප්‍රේල් 27**

ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය ජය ගැනීම පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආර්ථික විශේෂඥ ආචාර්ය ස්වානිම් වාග්ලේ මහතාගේ සම්පත් දායකත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත්වීම.

**අප්‍රේල් 28**

මේ වනවිට රටේ පවතින බලශක්ති, විදුලිය සහ ගෑස් සැපයුම පිළිබදව පවතින අර්බුදකාරී තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විදුලිබල සහ බලශක්ති අමාත්‍ය ගරු කංචන විජේසේකර, වෙළඳ සහ සමෘද්ධි සංවර්ධන අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ යන මහත්වරු සහ එම අමාත්‍යාංශ ලේකම්වරු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට සහභාගී වීම.

**අප්‍රේල් 29**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි වර්තමාන ගොඩනැගිල්ලේ ස්ථාපිත කර වසර 40 ක් සම්පූර්ණවීම.

## පාර්ලිමේන්තු බෝධීන් වහන්සේ ...

රාජ්‍ය තාන්ත්‍රික ආගමික සංස්කෘතික හා සාමාජීය ඉතිහාසයකට උරුමකම් ඇති, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුර බෝධීන් වහන්සේ ශාඛාවක්, ශ්‍රී ලංකා රාජ්‍යය කරවන කේන්ද්‍රස්ථානයක් වන ශ්‍රී ජයවර්ධනපුර පිහිටි පාර්ලිමේන්තු භූමියේ රෝපණය කිරීම සඳහා ලබාදෙන ලෙස පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය හා බෞද්ධ සංගමය විසින් එකල අටමස්ථානාධිපති හිමියන් වෙත කරන ලද ඉල්ලීමකට අනුව, මනා පුද සත්කාර කරමින් එය නිරතුරුව රැක බලා ගන්නා  බවට සපථ කළ පොරොන්දුව මත එකල උත්සවශ්‍රීයෙන් අංකුර බෝධීන් වහන්සේ රෝපණය කිරීම සිදු කර ඇත.












# පාර්ලිමේන්තු විත්ති

විශේෂ පුවත් හසුන කලාපය I 22 වැනි කාණ්ඩය I අප්‍රේල් 2022
ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka